පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක 123

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
## නවවැනි පාර්ලිමේන්තුව

(පස්වැනි සභාවාරය)

# රට තුළ සීඝ්‍ර ලෙස පැතිරෙමින් පවතින මත්ද්‍රව්‍ය උවදුර
# වහා පාලනය කොට මුලිනුපුටා දැමීම සඳහා
# ක්‍රියාත්මක කළ යුතු ක්‍රමවේද පිළිබඳව කරුණු සොයා බලා
# ඒ පිළිබඳව නිරීක්ෂණ හා නිර්දේශ
# පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම සඳහා වන
# පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවේ
# වාර්තාව

ඉදිරිපත් කරන ලද්දේ

විශේෂ කාරක සභාවේ සභාපති

**ගරු ටිරාන් අලස් මහතා, පා.ම. විසිනි**

මුද්‍රණය කිරීමට ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව නියෝග කළේ 2024 සැප්තැම්බර් මස 04 වැනි දා

# පටුන


| | | |
|---|---|---|
| | **කාරක සභාවේ සාමාජිකත්වය** | **i** |
| | **කාරක සභාවේ පසුබිම** | **ii** |
| | **යොමුකිරීමේ අනුදේශ** | **iii** |
| | **කාරක සභාවේ ක්‍රියාකාරීත්වය** | **iv** |
| | **කාරක සභාවේ අභිමතාර්ථය** | **v** |
| | **කාරක සභාවේ නිර්දේශ ලබා දීමේ අරමුණු** | **v** |
| | **කාරක සභාව විසින් නිරීක්ෂණය කරන ලද කරුණු** | **vi – viii** |
| **1.** | **මත්ද්‍රව්‍ය සඳහා වන ඉල්ලුම පාලනය කිරීම** | **1** |
| 1.1 | දැනුවත් කිරීම මගින් | 1 |
| 1.1.1 | පෙර පාසැල් දරුවන් | 1 |
| 1.1.2 | පාසැල් තෘතීයික අධ්‍යාපනික ආයතන, වෘත්තීය අධ්‍යාපනික ආයතන සහ තරුණ ප්‍රජාව | 1 - 3 |
| 1.1.3 | ආගමික අධ්‍යාපනික ආයතන | 4 |
| 1.1.4 | ප්‍රජාව | 4 - 5 |
| 1.2 | මාධ්‍ය හා සමාජ මාධ්‍යවල ක්‍රියාකාරීත්වය හා ප්‍රචාරණය | 6 - 7 |
| 1.3 | රාජ්‍ය ආයතනවල වගකීම | 7 - 8 |
| 1.4 | මත්ද්‍රව්‍ය නිවාරණය | 8 |
| 1.4.1 | රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතනවල මැදිහත්වීම | 8 – 11 |
| **2.** | **මත්ද්‍රව්‍ය සැපයුම පාලනය කිරීම** | **12** |
| 2.1 | ශක්තිමත් ආරක්ෂක වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කිරීම | 12 - 15 |
| 2.2 | යාවත්කාලීන වූ තාක්ෂණික ක්‍රමවේදයන් සහ තොරතුරු භාවිත කිරීම | 15 - 17 |
| 2.3 | නෛතික සීමාවන් පුළුල් කිරීම සහ දණ්ඩනයන් | 17 - 21 |
| **3.** | **ප්‍රතිකාරය හා පුනරුත්ථාපනය** | **22** |
| 3.1 | පුනරුත්ථාපනය | 22 |
| 3.2 | ප්‍රතිකාරය | 22 |
| 4. | **මත්ද්‍රව්‍ය පාලන ජාතික කොමිෂන් සභාවක් පිහිටුවීම** | **23** |
| 4.1 | කොමිෂන් සභාවේ සංයුතිය සහ නියෝජනය | 23 |
| 4.2 | උපදේශක සභාවක් පිහිටුවීම | 23 |
| 4.3 | කොමිෂන් සභාවේ බලතල සහ කාර්යයන් | 23 - 24 |
| 4.4 | වෙනත් ප්‍රතිපාදන | 24 |

## කාරක සභාවේ සාමාජිකත්වය

ගරු ටිරාන් අලස් මහතා (සභාපති)

ගරු නීතිඥ සිසිර ජයකොඩි මහතා

ගරු (වෛද්‍ය) සීතා අරඹේපොල මහත්මිය

ගරු බුද්ධික පතිරණ මහතා

ගරු ජයන්ත සමරවීර මහතා

ගරු (වෛද්‍ය) ගයාෂාන් නවනන්ද මහතා

ගරු (වෛද්‍ය) උපුල් ගලප්පත්ති මහතා

ගරු (මේජර්) සුදර්ශන දෙනිපිටිය මහතා

ගරු අසංක නවරත්න මහතා

ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ මහතා

ගරු තවරාජා කලෙයි අරසන් මහතා

ගරු මංජුලා දිසානායක මහත්මිය

## කාරක සභාවේ පසුබිම

මේ වනවිට මත් උවදුර රට තුළ දරුණු ව්‍යසනයක් ලෙස පැතිර යමින් පවතින හෙයින් ද; නාගරික ප්‍රදේශවල පමණක් නොව දුර බැහැර ග්‍රාමීය ප්‍රදේශවල සමාජයේ යහ පැවැත්මට මෙමඟින් දැඩි බලපෑමක් එල්ල වී ඇති හෙයින්ද; ස්ත්‍රී පුරුෂ භේදයකින් තොරව සමාජයේ සෑම තරාතිරමකම පුද්ගලයන් මෙහි ග්‍රහණයට ලක් වෙමින් පවතින හෙයින් ද; විශේෂයෙන් පාසල් දරුවන් සහ තරුණ පරපුර මත් උවදුරෙහි ගොදුරු බවට පත්වීම සීඝ්‍රයෙන් ඉහළ යමින් පවතින හෙයින් ද; මත්ද්‍රව්‍ය ජාවාරම හා සම්බන්ධ සංවිධානාත්මක කණ්ඩායම් විසින් සිදු කරන අපරාධ හේතුවෙන් සමාජය තුළ භීෂණකාරී තත්ත්වයක් උද්ගත වී ඇති හෙයින් ද; මෙම තත්ත්වය වහා පාලනය නොකළහොත් සමාජමය, ආර්ථිකමය හා සෞඛ්‍යමය වශයෙන් ඇතිවන දැඩි පරිහානිය යථා තත්ත්වයට පත් කිරීම දුෂ්කර වන හෙයින් ද; රට තුළ සීඝ්‍රයෙන් පැතිරෙමින් පවතින මත්ද්‍රව්‍ය උවදුර වහා පාලනය කොට මුලිනුපුටා දැමීම සඳහා ක්‍රියාත්මක කළ යුතු ක්‍රමවේද පිළිබඳ කරුණු සොයා බලා ඒ පිළිබඳව නිරීක්ෂණ හා නිර්දේශ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම සඳහා වන පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවක් පත් කරන ලෙස ඉල්ලමින් පහත සඳහන් මන්ත්‍රීවරයන් විසින් 2023 ජුනි මස 08 දින යෝජනා සම්මතයක් ගෙන එන ලදී.

ගරු නීතිඥ අනුර ප්‍රියදර්ශන යාපා මහතා
ගරු (මහාචාර්ය) තිස්ස විතාරණ මහතා
ගරු ඩලස් අලහප්පෙරුම මහතා
ගරු විමල් වීරවංශ මහතා
ගරු වාසුදේව නානායක්කාර මහතා
ගරු දයාසිරි ජයසේකර මහතා
ගරු උදය ගම්මන්පිල මහතා
ගරු ජයන්ත සමරවීර මහතා
ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි
ගරු අසංක නවරත්න මහතා සහ
ගරු වීරසුමන වීරසිංහ මහතා
ගරු ගෙවිඳු කුමාරතුංග මහතා

## යොමු කිරීමේ අනුදේශ

- කථානායකවරයා විසින් කාරක සභාවෙහි සභාපතිවරයා සහ සාමාජික මන්ත්‍රීවරයන් නම් කළ යුතුය.
- පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 101 හි විධිවිධාන ප්‍රකාරව කාරක සභාව සාමාජික මන්ත්‍රීවරයන් දොළොස් දෙනෙකුට (12) නොවැඩි විය යුතුය.

- එම කාරක සභාවට—

(අ) සිය ගණපූරණය නියම කර ගැනීමට ද;

(ආ) ඉහත සඳහන් කරුණු සම්බන්ධයෙන් පුළුල් අධ්‍යයනයක් සිදු කිරීම සඳහා කාරක සභාව විසින් අවශ්‍ය යැයි තීරණය කරනු ලබන පරිදි, ඕනෑම තැනැත්තෙකු එම කාරක සභාව ඉදිරියට කැඳවීමට ද, ඕනෑම ලියවිල්ලක් හෝ වාර්තාවක් ලබා දෙන ලෙසට ඕනෑම තැනැත්තෙකුට නියම කිරීමට ද, එකී සියලු සාක්ෂි, ලිඛිතව හෝ වාචිකව, ලබා ගැනීමට ද;

(ඇ) කාරක සභාවේ සහාය පිණිස අදාළ ක්ෂේත්‍රයන්හි විශේෂඥ දැනුමක් ඇති පුද්ගලයන්ගේ සහ ප්‍රවීණයන්ගේ සේවය ලබා ගැනීමට ද; සහ

(ඈ) කලින් කල අන්තර්වාර වාර්තා ඉදිරිපත් කිරීමට ද පාර්ලිමේන්තුව කල් තබනු ලැබ හෝ වාරාවසාන කරනු ලැබ තිබුණ ද රැස්වීම් පවත්වාගෙන යාමට ද බලය තිබිය යුතු ය.

- කාරක සභාවේ වාර්තාව එහි පළමු රැස්වීමේ දින සිට මාස හයක (06) කාලයක් හෝ පාර්ලිමේන්තුව විසින් දීර්ඝ කරනු ලබන එවැනි කාල පරිච්ඡේදයක් ඇතුළත දී පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු ය.

(2023 ජුනි මස 08 වැනි දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාව මඟින් නියම කර ඇති පරිදි පාර්ලිමේන්තුවට වාර්තා කිරීම සඳහා කාරක සභාවට තවදුරටත් කාලය අවශ්‍ය වූ බැවින්, පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග අංක 102 ප්‍රකාරව එකී කාරක සභාවට ලබාදී ඇති කාලසීමාව, 2024 සැප්තැම්බර් මස 27 දින දක්වා දීර්ඝ කිරීමට පාර්ලිමේන්තුවේ අනුමැතිය හිමිවිය)

ඒ අනුව, ගරු ටිරාන් අලස් මහතාගේ සභාපතිත්වයෙන් යුතුව මන්ත්‍රීවරයන් 12 දෙනෙකුගේ සාමාජිකත්වයෙන් රට තුළ සීඝ්‍ර ලෙස පැතිරෙමින් පවතින මත්ද්‍රව්‍ය උවදුර වහා පාලනය කොට මුලිනුපුටා දැමීම සඳහා ක්‍රියාත්මක කළ යුතු ක්‍රමවේද පිළිබඳව කරුණු සොයා බලා ඒ පිළිබඳව නිරීක්ෂණ හා නිර්දේශ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම සඳහා වන පාර්ලිමේන්තු විශේෂ කාරක සභාව පත් කරන ලද බව ගරු කථානායකතුමා විසින් 2023 ජූලි මස 01 වන දින පාර්ලිමේන්තුවට නිවේදනය කරන ලදි.

## කාරක සභාවේ ක්‍රියාකාරීත්වය

කාරක සභාව සිය ප්‍රථම රැස්වීම 2023 ජූලි මස 27 වන දින පවත්වන ලද අතර, මේ දක්වා රැස්වීම් වාර 11 ක් පවත්වා ඇත.

කාරක සභාව විසින් මහජනතාව වෙතින් ද රට තුළ සීඝ්‍ර ලෙස පැතිරෙමින් පවතින මත්ද්‍රව්‍ය උවදුර වහා පාලනය කොට මුලිනුපුටා දැමීම සම්බන්ධයෙන් නියෝජනයන් කැඳවමින්, 2023 සැප්තැම්බර් මස 13 වන දින භාෂාත්‍රයෙන්ම පුවත්පත් දැන්වීම් පළ කරන ලදි. ඒ අනුව, සිය නියෝජනයන් කාරක සභාව වෙත ලබා දීම සඳහා මහජනතාව වෙත ලබා දී තිබුණු මාසයක කාලය අවසානයේ දී ලැබී තිබුණු නියෝජනයන් සංඛ්‍යාව 58 කි. එමෙන්ම, රාජ්‍ය නොවන ආයතන සහ ක්ෂේත්‍රයේ ක්‍රියාකාරීන් 9 දෙනෙකු සහ රාජ්‍ය ආයතන 10 ක් සිය යෝජනා කාරක සභාව වෙත ලබා දී තිබුණි.

තවද, මත්ද්‍රව්‍ය උවදුර මර්දනය කිරීමේ කාර්යය සඳහා ක්‍රියා කරනු ලබන රාජ්‍ය ආයතන, රාජ්‍ය නොවන ආයතන, මත්ද්‍රව්‍ය නිවාරණ ක්ෂේත්‍රයේ ක්‍රියාකාරීන් කාරක සභාව ඉදිරියට කැඳවමින් ඔවුන්ගේ අදහස් හා යෝජනා ලබා ගැනීමට ද කාරක සභාව කටයුතු කරන ලදි.

කාරක සභාව වෙත ඉදිරිපත් කරන ලද යෝජනා සහ අදහස් මෙන්ම මහජන නියෝජනයන් ද සැලකිල්ලට ගත් කාරක සභාව, පහත දක්වා ඇති පරිදි ප්‍රධාන තේමාවන් තුනක් යටතේ මත්ද්‍රව්‍ය උවදුර පාලනය සඳහා වන කරුණු විශ්ලේෂණය කිරීමට තීරණය කරන ලදි:

I. මත් ද්‍රව්‍ය සඳහා වන ඉල්ලුම පාලනය කිරීම
II. මත් ද්‍රව්‍ය සැපයුම පාලනය කිරීම
III. ප්‍රතිකාරය හා පුනරුත්ථාපනය

කාරක සභාව විසින් මත්ද්‍රව්‍ය උවදුර පාලනය කිරීම සඳහා නෛතික අණ පනත් සංශෝධනය කිරීම සම්බන්ධයෙන්ද විශේෂයෙන් සලකා බැලීමට තීරණය කරන ලදි.

## කාරක සභාවේ අභිමතාර්ථය

ශ්‍රී ලංකාවේ දැනට පැතිර යමින් පවතින මත්ද්‍රව්‍ය උවදුර පාලනය කොට මුලිනුපුටා දැමීම මගින් ආධ්‍යාත්මික වශයෙන් පරිපූර්ණ පුරවැසියකු නිර්මාණය කිරීම සහ සදාචාරාත්මක හා සුරක්ෂිත සමාජයක් ඇතිකිරීමත්, මත්ද්‍රව්‍ය භාවිතයෙන් ඇතිවන සමාජයීය, ආර්ථික හා සෞඛ්‍ය ප්‍රතිවිපාක වලින් වර්තමාන හා අනාගත පරපුර ආරක්ෂා කිරීමෙන් සමෘද්ධිමත් ජන සමාජයක් ඇති කිරීම සඳහා මගපෙන්වීම කාරක සභාවේ මූලික අභිමතාර්ථය වේ.

## කාරක සභාවේ නිර්දේශ ලබාදීමේ අරමුණු

i. රටේ අනාගතය වන ළමා හා තරුණ පරපුර ඇතුළු සියලු පුරවැසියන් මත්ද්‍රව්‍ය උවදුරේ ගොදුරු බවට පත්වීම වළකාලීම
ii. සමාජය තුළ මත්ද්‍රව්‍ය භාවිතය හා ජාවාරම හේතුවෙන් ඇතිවන ව්‍යසනකාරී තත්ත්වය වැළැක්වීම
iii. මත්ද්‍රව්‍ය භාවිතය හේතුවෙන් ඇතිවන සමාජ, සංස්කෘතික, සදාචාරාත්මක ආර්ථික හා සෞඛ්‍යමය පරිහානිය වළක්වා ගැනීම
iv. මත්ද්‍රව්‍ය ජාවාරම හේතුවෙන් නීති විරෝධී ලෙස රටින් බැහැරට යන විදේශ විනිමය නතර කිරීමට අවශ්‍ය පියවර ගැනීම
v. නීතිවිරෝධී මත්ද්‍රව්‍ය ජාවාරම සහ බෙදා හරිනු ලබන ජාලයන් බිඳ හෙළීම
vi. දුම්කොළ ,මද්‍යසාර කර්මාන්තයෙන් සහ අනෙකුත් මත්ද්‍රව්‍ය ජාවාරම් හේතුවෙන් සිදුවන බලපෑම් වලින් ජනතාව ආරක්ෂා කිරීම සඳහා පවතින නෛතික ප්‍රතිපාදනයන් ක්‍රියාත්මක කරවීම සහ අදාළ සංශෝධන ඉදිරිපත් කිරීම.
vii. ජාත්‍යන්තරව සහ ජාතිකව මත්ද්‍රව්‍ය පිළිබඳව තිබෙන මිත්‍යාව හා ව්‍යසනය පිළිබඳ නිරවුල් අවබෝධයක් සහිත පුරවැසියෙක්, පවුල් ඒකකයක් සහ සමාජයක් නිර්මාණය කිරීම
viii. මත්ද්‍රව්‍යයට ඇබ්බැහිවූවන් මුළුමනින්ම ඉන් නිදහස් කර ගැනීම සඳහා වන ශක්තිමත් සහ ඵලදායී ප්‍රතිකාර සහ පුනරුත්ථාපන ක්‍රමවේදයන් ස්ථාපනය කිරීම

## කාරක සභාව විසින් නිරීක්ෂණය කරන ලද කරුණු

i. කාරක සභාව වෙත යොමු කරන ලද විශ්ලේෂණාත්මක දත්ත සහ කරුණු අනුව පාසැල් ආශ්‍රිතව මත්ද්‍රව්‍ය පැතිරයාමේ ප්‍රවණතාවයක් ඇති බව

ii. මද්‍යසාර, දුම්කොළ ඇතුළු මත්ද්‍රව්‍ය සඳහා ඇති ඉල්ලුම ස්වාභාවික ඉල්ලුමක් නොව, කෘත්‍රිමව නිර්මාණය කරන ලද ඉල්ලුමක් බව

iii. මත්ද්‍රව්‍ය නිසා ඇති වී තිබෙන අභියෝගය ජාත්‍යන්තර ජාලගත බිහිසුණු ව්‍යසනයක් බව සහ ජාතික ප්‍රමුඛතාවයක් සේ සලකා එය මුලිනුපුටා දැමීමට කටයුතු කර නොමැති බව

iv. ප්‍රධාන පෙළේ ශ්‍රී ලාංකික මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවන් විදේශගතව සිට ශ්‍රී ලංකාව තුළ මත්ද්‍රව්‍ය බෙදා හැරීම සිදු කරන බව

v. ජාත්‍යන්තර මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවන් නිරන්තරයෙන් නවීන තාක්ෂණය යොදා ගනිමින් මෙම ජාවාරමේ නියැළෙන නමුත් එය වැළැක්වීම සඳහා ඊට සරිලන අයුරින් තාක්ෂණය යාවත්කාලීන වීමක් සිදු වී නොමැති බව

vi. විදේශගතවන සහ මෙරටට පැමිණෙන මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවන් හඳුනාගත හැකි වන පරිදි නවීන තාක්ෂණික උපකරණ ගුවන් තොටුපළ සහ වරාය පරිශ්‍රයන් තුළ ක්‍රියාත්මක නොවන බව.

vii. යෝජනා කර ඇති සංශෝධන දුම්කොළ සහ මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය පනතට ඇතුළත් කිරීම අනවශ්‍ය ලෙස ප්‍රමාද වී ඇති බව

viii. මත්ද්‍රව්‍ය, මාදක ඖෂධ සහ මනෝවර්තක ද්‍රව්‍ය, දුම්කොළ හා මද්‍යසාර සම්බන්ධයෙන් දැනට භාවිත වන නෛතික ප්‍රතිපාදනයන් ප්‍රමාණාත්මක නොවන බව.

ix. ඇතැම් නීති හා රෙගුලාසි හඳුන්වාදීම මගින් මත්ද්‍රව්‍ය භාවිතය වැඩි වී ඇති බව නිරීක්ෂණය වන අතර, ඇතැම් නීති හා රෙගුලාසි මගින් මත්ද්‍රව්‍ය වැළැක්වීම පිණිස පවතින නීති හා ශ්‍රී ලංකාව දැනට අත්සන් තබා ඇති ජාත්‍යන්තර සම්මුති යටපත් වන බැවින්, මත්ද්‍රව්‍ය වැළැක්වීමට හා මුලිනුපුටා දැමීමට ඉවහල් වන ලෙස මෙම නීති හා රෙගුලාසි සංශෝධනය විය යුතු බව.

x. මත්ද්‍රව්‍ය වරදකරුවන්ට එරෙහිව නඩු පැවරීමේ ක්‍රියාවලියේ දෝෂ සහගත තැන් පවතින බව සහ මත්ද්‍රව්‍ය සම්බන්ධ නඩු කටයුතු අවසන් වීම සඳහා කල් ගතවන බව.

xi. මත්ද්‍රව්‍ය වැරදි සඳහා වරදකරුවන් වන පුද්ගලයන් වෙනත් වැරදි සඳහා වරදකරුවන් වන පුද්ගලයන් සමග එකට බන්ධනාගාරගත කිරීම සුදුසු නොවන බව.

xii. මත්ද්‍රව්‍ය වැරදි සඳහා දැනට නියම කර ඇති දඬුවම් සහ දඩ මුදල් ප්‍රමාණාත්මක නොවන බව සහ කාලානුරූපීව ඒවා සමාලෝචනය වී නොමැති බව.

xiii. පුවක් සහ දුම්කොළ ආශ්‍රිත මත්ද්‍රව්‍ය වර්ග මෙන්ම අවභාවිතව සිදු කෙරෙන මාදක හා මනෝවර්තක ඖෂධ වර්ග සහ අනෙකුත් මත්ද්‍රව්‍ය හඳුනා ගැනීම සඳහා අවශ්‍ය ප්‍රමාණවත් රසායනාගාර මෙන්ම ක්ෂේත්‍ර පරීක්ෂණ උපකරණ නොමැති බව

xiv. ජංගම දුරකථන සඳහා සිම්පත් ලබා දීමේදී ඒවා භාවිත කරන අයගේ අනන්‍යතාවය තහවුරු කර ගැනීමේ ක්‍රියාවලිය තුළ දුර්වලතාවයන් පවතින බව.

xv. මත්ද්‍රව්‍ය සම්බන්ධයෙන් ආවේක්ෂණ කටයුතු සිදු කරනු ලබන රාජ්‍ය ආයතන සඳහා ප්‍රමාණවත් තරම් පිරිස් බලය සහ යටිතල පහසුකම් නොමැති බව.

xvi. මත්ද්‍රව්‍ය සම්බන්ධයෙන් කටයුතු සිදු කරනු ලබන රාජ්‍ය ආයතන අතර ප්‍රමාණවත් තරම් අන්තර් සම්බන්ධතාවයක් නොමැති බව.

xvii. මත්ද්‍රව්‍ය භාවිත කරන්නන්, පුනරුත්ථාපනය හා ප්‍රතිකාර සඳහා යොමු කර සිටින්නන්, බන්ධනාගාරගත කර සිටින්නන් සහ පුනරුත්ථාපනයෙන් පසුව සමාජගත කර සිටින්නන් සම්බන්ධයෙන් ප්‍රමාණවත් තොරතුරු ඇතුළත් දත්ත පද්ධතියක් නොමැති බව.

xviii. මත්ද්‍රව්‍ය වැටලීම් සඳහා සහභාගී වන නීතිය ක්‍රියාත්මක කරන නිලධාරීන් සඳහා අවශ්‍ය අවම පහසුකම් නොමැති බව.

xix. දුම්කොළ සහ මද්‍යසාර සඳහා විද්‍යාත්මක බදු ප්‍රතිපත්තියක් නොමැති වීම සහ එම බදු ගණනය කිරීම සඳහා පාරදෘශ්‍ය යාන්ත්‍රණයක් නොමැති බව

xx. මුහුදේ යාත්‍රා කරන බහු දින ධීවර යාත්‍රා මෙන්ම කුඩා බෝට්ටු ප්‍රමාණවත් පරිදි විමර්ශනයට ලක් කිරීම සඳහා අවශ්‍ය මානව හා භෞතික සම්පත් සීමා සහිත බව.

xxi. නීති විරෝධී ඖෂධ සම්බන්ධ වැටලීම්වලදී ශ්‍රී ලංකා පොලීසිය හා සෙසු ආයතනවලට ජාතික ඖෂධ නියාමන අධිකාරියේ බලය ලත් නිලධාරීන්ගේ දායකත්වය ලබාගත යුතු බව.

xxii. මත්ද්‍රව්‍යවලට ඇබ්බැහිවූවන් එයින් නිදහස් කර ගැනීම සඳහා මෙන්ම පුනරුත්ථාපනය කිරීම සඳහා දැනට භාවිත කරනු ලබන ක්‍රමවේදයන් වඩාත් පුළුල් විය යුතු බව හා ඔවුන් මත්ද්‍රව්‍ය වලින් පූර්ණ වශයෙන් නිදහස් වීම දක්වා යන තෙක් අවශ්‍ය අධීක්ෂණ කටයුතු සිදු විය යුතු බව.

xxiii. දැනට ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක කරනු ලබන මත්ද්‍රව්‍ය භාවිතයෙන් ඇතිවන ප්‍රතිවිපාක පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහන් වඩාත් සැලසුම් සහගතව සහ ප්‍රමාණාත්මකව ක්‍රියාත්මක කළ යුතු බව

xxiv. පුනරුත්ථාපනයෙන් පසුව බාහිර සමාජයට මුදා හරින පුද්ගලයන්ගෙන් යම් ප්‍රතිශතයක් නැවත මත්ද්‍රව්‍ය භාවිතයට හා බෙදා හැරීමට යොමුවන බව.

xxv. අත්අඩංගුවට ගනු ලබන මත් ද්‍රව්‍ය අධිකරණ කටයුතු අවසන් වීමට පෙර විනාශ කිරීමේ ක්‍රියාවලිය වර්තමානය වන විට ආරම්භ කර ක්‍රියාත්මක වුවත් දහනාගාරයේ ධාරිතාවය වැඩි කිරීම අත්‍යවශ්‍ය බව

xxvi. වර්තමානය වන විට මත්ද්‍රව්‍ය රට තුළට ගලා ඒම වැළැක්වීම සඳහා සැළකිය යුතු ඒකාබද්ධ වැඩ පිළිවෙළක් පොලිස් දෙපාර්තමේන්තුව, ත්‍රිවිධ හමුදාව, ශ්‍රී ලංකා රේගුව සහ අදාළ අනෙකුත් ආයතන විසින් දේශීය මෙන්ම ජාත්‍යන්තර බුද්ධි අංශ සමගද ඒකාබද්ධ වී ක්‍රියාත්මක වුවද එකී ආයතන අතර අන්තර් සම්බන්ධීකරණය වඩාත් පුළුල් කළ යුතු බව.

xxvii. ශ්‍රී ලංකාව තුළට වෙනත් කාර්යයන් සඳහා ආනයනය කරන ලද පූර්වජ රසායන ද්‍රව්‍ය මගින් කෘත්‍රිමව මත්ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීමේ හැකියාවක් පවතින බව.

# මත්ද්‍රව්‍ය උවදුර පාලනය කිරීම සඳහා කාරක සභාව විසින් ඉදිරිපත් කරනු ලබන නිර්දේශ

## 1. මත්ද්‍රව්‍ය සඳහා වන ඉල්ලුම පාලනය කිරීම

### 1.1 දැනුවත් කිරීම මගින්

#### 1.1.1 පෙර පාසැල් දරුවන්

i. ජීවන කුසලතා ඉගැන්වීම් තුළින් පෙර පාසැල් දරුවන්ට මද්‍යසාර දුම්කොළ ඇතුළු අනෙකුත් මත්ද්‍රව්‍ය භාවිතයේ ආදීනව පිළිබඳ අවබෝධයක් ලබා දීමටත් ඒවා පිළිකුල් කිරීමේ හැකියාව ඔවුන් තුළ ඇති කිරීමටත්, දුම්වැටි මද්‍යසාර ඇතුළු අනෙකුත් මත්ද්‍රව්‍ය භාවිතය සඳහා පෙළඹවීම් ඇතිකරන සාධක හඳුනා ගැනීමට මෙන්ම ඒවාට ප්‍රතිරෝධයක් දරුවන් තුළ ඇති කිරීමටත් සුදුසු ක්‍රියාකාරකම් පූර්ව ළමා විය සංවර්ධනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තියට සහ වැඩපිළිවෙලට ඇතුළත් කිරීම.

ii. ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අනුයුක්ත මුල් ළමාවිය සංවර්ධන නිලධාරීන් මඟින් ඉහත ක්‍රියාවලිය පෙර පාසල තුළ ක්‍රියාත්මක කිරීම සහ එම වැඩසටහන අධීක්ෂණය කිරීම සඳහා, දුම්කොළ හා මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය සහ අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය මගින් අදාළ රේඛීය අමාත්‍යාංශය හරහා අවශ්‍ය පියවර ගැනීම.

#### 1.1.2 පාසැල්, තෘතීයික අධ්‍යාපනික ආයතන, වෘත්තීය අධ්‍යාපනික ආයතන සහ තරුණ ප්‍රජාව

i. පාසල් දරු පරපුර වෙත යහපත් හා සෞඛ්‍යමත් ජීවිතයක් ගොඩ නගා ගැනීම සඳහා අවශ්‍ය දැනුම හා අවබෝධය ලබා දීම පිණිස වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සහ ශිෂ්‍ය ප්‍රජාවන් මත්ද්‍රව්‍ය භාවිතයේ හිස්බව හා යථාර්ථය පිළිබඳව දැනුවත් කිරීම සහ මත්ද්‍රව්‍ය භාවිතය නීරස සහ වේදනාත්මක දෙයක් බව පෙන්වා දීමට සුදුසු වැඩ සටහන් හඳුන්වා දීම අධ්‍යාපන අමාත්‍යාංශයේ වගකීම වන්නේය.
(එම වැඩසටහන්වල ප්‍රතිඵලයක් ලෙස ශිෂ්‍ය ප්‍රජාව තුළ ඇතිවන ආකල්පමය වෙනස සහ වාතාවරණය අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය සහ දුම්කොළ සහ මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය නිර්දේශ කරන දර්ශක මත, විද්‍යාත්මකව මැනීමක් සිදු කර එම ප්‍රතිඵලය කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත වාර්තා කිරීමේ වගකීම විදුහල්පතිවරයාට පැවරෙනු ඇත.)

ii. පාසල් මට්ටමින් සුමිතුරු සංසද පිහිටුවීම සහ පවත්වාගෙන යාම. (ඊට අදාළ ක්‍රියාකාරකම් සිදු කිරීමට අවශ්‍ය තාක්ෂණික සහාය සහ මග පෙන්වීම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අනුයුක්ත අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයට අනුබද්ධ නිලධාරින් විසින් සිදු කිරීම.)

iii. අධ්‍යාපන ආයතන පරිශ්‍රයන් දුම්කොළ නිෂ්පාදන, මද්‍යසාර සහ අනෙකුත් සියලු මත්ද්‍රව්‍ය භාවිතයෙන්, ප්‍රවර්ධනයෙන් හා වෙළඳාමෙන් තොර කලාප බවට තහවුරු කර පවත්වාගෙන යාම වෙනුවෙන් අවශ්‍ය මගපෙන්වීම් ඇතුළත් කරමින් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් නිකුත් කර ඇති චක්‍රලේඛයන්ට අනුගත වෙමින් කටයුතු කිරීම සහ එම චක්‍රලේඛවල අන්තර්ගත කරුණු සුදුසු පරිදි කලින් කලට යාවත්කාලීන කිරීම.
(මෙම ක්‍රියාවලිය අධීක්ෂණය කිරීම සඳහා සෑම අධ්‍යාපන කලාප කාර්යාලයක් සඳහාම විශේෂ නිලධාරියකු නම් කිරීම සහ එම නිලධාරියා අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ ක්ෂේත්‍ර නිලධාරීන් සමග සම්බන්ධීකරණය කිරීම.)

iv. මාර්ගගත ක්‍රමවේද ඔස්සේ පාසල් දරුවන් ඉලක්ක කරමින් මත්ද්‍රව්‍ය ප්‍රවර්ධන කටයුතු සිදු කිරීම වැළැක්වීම සඳහා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව මගින් එම ක්‍රමවේදයන්හි අන්තර්ගතය පාලනය කිරීම සඳහා පියවර ගැනීම.

v. උපකාරක පන්ති ආශ්‍රිතව දුම්කොළ මද්‍යසාර සහ මත්ද්‍රව්‍ය ප්‍රචලිත කිරීම වැළැක්වීම සඳහා එම ගුරුවරුන් දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ වගකීම සහ එම ආයතන ආශ්‍රිතව මත්ද්‍රව්‍ය ප්‍රචලිත කිරීමේ ක්‍රියාකාරකම් සිදුවන්නේද යන්න සොයා බැලීමේ වගකීම දුම්කොළ සහ මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය සහ අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයට පැවරීම.

vi. ළමුන් හා යෞවනයන් අතර දුම්කොළ, මද්‍යසාර හා මත්ද්‍රව්‍ය සම්බන්ධයෙන් නිර්මාණය කරනු ලබන ඉල්ලුම අවම කිරීමේ ක්‍රියාකාරකම්, අධීක්ෂණය කිරීමට සහ අවශ්‍ය මග පෙන්වීම් සිදු කිරීම සඳහා දුම්කොළ සහ මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරියේ ප්‍රධානත්වයෙන් අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය, අධ්‍යාපන අමාත්‍යාංශය, නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය, සෞඛ්‍ය අමාත්‍යාංශය සහ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව, ඇතුළු අනෙකුත් අදාළ සියලු රාජ්‍ය ආයතන නියෝජනය කරන නිලධාරීන් සහ මත්ද්‍රව්‍ය නිවාරණ ක්ෂේත්‍රයේ පිළිගත් ස්වේච්ඡා සංවිධාන නියෝජිතයන් උපරිම පස් දෙනෙකු ඇතුළත් වන පරිදි ඉහළ මට්ටමේ වගකීම් යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම.

vii. ජාත්‍යන්තර පාසල් සහ උපකාරක පන්ති ඇතුළු පෞද්ගලික පාසල් ආශ්‍රිතව ඉහත වැඩසටහන් ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය කිරීමේ වගකීම අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය සහ දුම්කොළ සහ මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය වෙත පැවරීම.

viii. පාසල්වල, වෘත්තීය පුහුණු ආයතනවල සහ විශ්ව විද්‍යාලවල මත්ද්‍රව්‍ය නිවාරණ ක්‍රියාවලියට සහ මත්ද්‍රව්‍ය භාවිතයට අදාළ සිදුවීම් සහ පැමිණිලි පිළිබඳව ජාතික තොරතුරු පද්ධතියක් පවත්වාගෙන යාමේ අරමුණින් එම වගකීම අදාළ ආයතන ප්‍රධානීන්ද ඇතුළත් කමිටුවකට පැවරීම සහ ඒ සම්බන්ධයෙන් ජාතික මට්ටමින් තොරතුරු එක්රැස් කිරීම, සිතියම්ගත කිරීම සහ ප්‍රවණතාවයන් හඳුනා ගැනීමේ වගකීම ඊට අදාළ පුහුණු මොඩියුල සකස් කිරීම හා යාවත්කාලීන කිරීම අධ්‍යාපන අමාත්‍යාංශය, දුම්කොළ සහ මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය සහ අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය වෙත පැවරීම.

ix. තෘතීයික සහ වෘත්තීය පුහුණු අධ්‍යාපනික ආයතනවල අධ්‍යාපනය ලබන දරුවන් සහ තරුණ ප්‍රජාව තාක්ෂණිකව නිවැරදි අන්තර්ගතයක් මගින් ආමන්ත්‍රණය කිරීමට සහ දැනුවත් කිරීමට සුදුසු ක්‍රමවේදයක් සකස් කිරීම.

x. අදාළ අධ්‍යාපනික ආයතන හරහා ආචාර්යවරුන් දැනුවත් කිරීම.

xi. දරුවන් සහ තරුණ ප්‍රජාව මත්ද්‍රව්‍ය භාවිතයට යොමුවීම වැළැක්වීම සඳහා ඵලදායී අන්තර්ගත හා ක්‍රමවේද සහිත වැඩපිළිවෙළක් අඛණ්ඩව වෘත්තීය පුහුණු ආයතන සහ යොවුන් සේනාංක වැනි ආයතන තුළ ශිෂ්‍ය කේන්ද්‍රීයව සිදු කිරීම සහ එම ක්‍රියාකාරකම් පසු විපරම් සහ අධීක්ෂණය සිදු කිරීම.

xii. ඉහත කටයුතු ක්‍රියාත්මක කිරීම සඳහා අදාළ ආයතන ප්‍රධානීන් අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය හා දුම්කොළ සහ මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය සමග ඒකාබද්ධව යාන්ත්‍රණයක් සකස් කිරීම.

### 1.1.3 ආගමික අධ්‍යාපනික ආයතන

i. දහම් පාසැල් (බෞද්ධ, කතෝලික, හින්දු, ඉස්ලාම්) ආශ්‍රිතව දරුවන් මත් උවදුරින් නිදහස් කර ගැනීමේ දී ඔවුන්ට දැනෙන පරිදි ආමන්ත්‍රණය කළ හැකි ක්‍රමවේදයක් සකස් කිරීම සහ දහම් පාසැල් ගුරුවරුන් දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම සඳහා බුද්ධශාසන ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය විසින් පියවර ගැනීම. ඒ සම්බන්ධයෙන් ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අනුයුක්තව කටයුතු කරන අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය හා සම්බන්ධ මත්ද්‍රව්‍ය නිවාරණ ප්‍රතිකාර සහ පුනරුත්ථාපන නිලධාරින්, ශාසනාරක්ෂක බල මණ්ඩල සහ සෙසු ආගමික ආයතන සමග ප්‍රාදේශීය මට්ටමින් කටයුතු කිරීම සඳහා යාන්ත්‍රණයක් සකස් කිරීම.

ii. සියලු ආගමික ශිෂ්‍ය විද්‍යාර්ථීන් අධ්‍යාපනය හදාරනු ලබන පිරිවෙන් හා විද්‍යා පීඨ ඇතුළු උසස් අධ්‍යාපනික ආයතන කේන්ද්‍රකරගත් විද්‍යාත්මක මත්ද්‍රව්‍ය නිවාරණ දැනුම ලබාදීම සහ එම විද්‍යාර්ථීන් තුළින් ප්‍රජාපාදක මත්ද්‍රව්‍ය නිවාරණ හා ප්‍රතිකාර ක්‍රමවේදයන් ස්ථාපිත කිරීම.

iii. ජාතික ආගමික උත්සව පරිශ්‍රයන් කේන්ද්‍රකර ගනිමින් එකී ආගමික පරිසරය මද්‍යසාර දුම්කොළ හා මත්ද්‍රව්‍යවලින් නිදහස් පරිසරයක් බවට පත්කිරීම සඳහා මත්ද්‍රව්‍ය නිවාරණ ප්‍රායෝගික වැඩපිළිවළක් ක්‍රියාත්මක කිරීම බුද්ධ ශාසන ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය යටතට පැවරීම

### 1.1.4 ප්‍රජාව

i. දිස්ත්‍රික් ලේකම්ගේ මූලිකත්වයෙන් දිස්ත්‍රික් මත්ද්‍රව්‍ය නිවාරණ කමිටුව සහ සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකම ප්‍රාදේශීය ලේකම්ගේ ප්‍රධානත්වයෙන් ප්‍රාදේශීය මත්ද්‍රව්‍ය නිවාරණ කමිටුව බලාත්මක කොට ක්‍රියාත්මක කිරීම.

ii. එම කමිටු මගින් පහත සඳහන් ක්‍රියාකාරකම් සඳහා නායකත්වය ලබාදීම.

a. මත්ද්‍රව්‍ය සඳහා ඇබ්බැහි වූ පුද්ගලයන් හඳුනා ගැනීමට සහ ඉන් නිදහස්වීමට අවශ්‍ය උපකාරයන් ලබා ගන්නා ආකාරය පිළිබඳව ප්‍රජා මට්ටමින් දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම. මද්‍යසාර භාවිතයේ පෙනෙන /නොපෙනෙන හානි, යහ පැවැත්ම නැතිවී යාම, සිදුවන හානි අවම කර ගත හැකි ආකාර, මද්‍යසාර නිෂ්පාදනය, බෙදාහැරීම, අලෙවිකරණය, තොග සහ සිල්ලර වෙළෙඳාම වැනි විවිධ පැතිකඩයන් සම්බන්ධයෙන් මහජනතාව දැනුවත් කිරීම.

b. මද්‍යසාර, දුම්කොළ ඇතුළු මත්ද්‍රව්‍ය ප්‍රවර්ධනය, මත්ද්‍රව්‍ය භාවිතයට පුද්ගලයන් පෙළඹවීම, මද්‍යසාර, දුම්කොළ ඇතුළු මත්ද්‍රව්‍ය මර්දනයට එරෙහිව පවතින්නා වූ සාධක පිළිබඳව සමාජය දැනුවත් කිරීම හා එවැනි උත්සාහයන් ව්‍යර්ථ කිරීම සඳහා ප්‍රතිරෝධය දැක්විය යුතු ආකාර පිළිබඳවත් දැනුවත් කිරීම.

c. මද්‍යසාර, දුම්කොළ ඇතුළු මත්ද්‍රව්‍ය භාවිතයට එරෙහිව පවතින නීති කඩවීම් පිළිබඳව පොලිසිය, සුරාබදු දෙපාර්තමේන්තුව, මහජන සෞඛ්‍ය නිලධාරී කාර්යාලය හෝ ආහාර හා ඖෂධ පරීක්ෂක දැනුවත් කිරීම සඳහා මහජනතාව දිරිමත් කිරීම.

d. මත්ද්‍රව්‍ය භාවිත කරන පුද්ගලයන් විසින් දක්වන ඇතැම් හැසිරීම් රටාවන් සම්බන්ධයෙන් ඇති මිථ්‍යා විශ්වාස පිළිබඳව ප්‍රජාව දැනුවත් කිරීමට කටයුතු කිරීම මගින් එවැනි පුද්ගලයන් විසින් සිදු කරනු ලබන සමාජ විරෝධී ක්‍රියා මැඩ පැවැත්වීමට කටයුතු කිරීම.

e. මද්‍යසාර, දුම්කොළ ඇතුළු මත්ද්‍රව්‍ය නිසා සිදුවන හානිය පිළිබඳව දැනුවත් කිරීම සඳහා එම පවුල්වල සාමාජිකයන් මනෝවිද්‍යාත්මක සහායකයන් ලෙස කටයුතු කිරීමට ක්‍රමවේදයන් ඇති කිරීම.

f. මද්‍යසාර, දුම්කොළ නිෂ්පාදන ඇතුළු මත්ද්‍රව්‍ය භාවිතය සම්බන්ධව අධි අවදානම් සහිත පිරිස් (ධීවරයන්, ත්‍රීරෝද රථ රියැදුරන්, බස් රථ රියැදුරන්, ඉදිකිරීම් කර්මාන්තයේ සේවය කරන කම්කරුවන් සහ බන්ධනාගාර ගත වූවන්) අරමුණු කරගනිමින් මත්ද්‍රව්‍ය නිවාරණ හා ප්‍රතිකාර වැඩසටහන් සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම.

g. මුහුදේ දී සිදුවන මත්ද්‍රව්‍ය ප්‍රවාහනය හා මත්ද්‍රව්‍ය ජාවාරම් කටයුතුවලට මැදිහත්වීමෙන් ඇති විය හැකි ප්‍රතිවිපාක පිළිබඳව ධීවර ප්‍රජාව දැනුවත් කිරීම.

h. මත්ද්‍රව්‍ය භාවිතය පාලනය කිරීම සඳහා ගන්නා පියවර ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් විද්‍යාත්මක නිර්දේශ සහ තාක්ෂණික දත්ත පදනම් කරගනිමින් උපදේශන සේවා සැපයීම.

## 1.2 මාධ්‍ය හා සමාජ මාධ්‍යවල ක්‍රියාකාරීත්වය සහ ප්‍රචාරණය

i. මත්ද්‍රව්‍ය සඳහා අනවශ්‍ය ප්‍රචාරණයක් නොලැබෙන පරිදි මාධ්‍ය භාවිත කිරීම සම්බන්ධයෙන් මාධ්‍ය ආයතන/මාධ්‍යවේදීන් දැනුවත් කිරීම සහ ඔවුන්ගේ ක්‍රියාකාරකම් සම්බන්ධව අවධානයෙන් සිටීම. කිසියම් මත් ද්‍රව්‍යයක් ඍජු හෝ වක්‍රාකාරයෙන් ප්‍රවර්ධනය වන අයුරින් විද්‍යුත් හෝ මුද්‍රිත මාධ්‍ය හරහා සිදුවන ප්‍රචාරණයන් සම්බන්ධයෙන් එම ප්‍රවර්ධනයන් සඳහා ඍජු හෝ වක්‍රාකාරයෙන් වගකිව යුතු වන පුද්ගලයන්ට එරෙහිව කටයුතු කළ හැකිවන පරිදි නෛතික සහ ආයතනික ප්‍රතිසංස්කරණ හඳුන්වා දීම.

ii. 1991 අංක 25 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ පනත සංශෝධනය කිරීම මගින්, දුම්කොළ නිෂ්පාදන, මද්‍යසාර සහ මත්ද්‍රව්‍ය ප්‍රචලිත කිරීම සඳහා යොදා ගන්නා සමාජ මාධ්‍ය ජාලාවල අන්තර්ගතය සහ එම ජාලවලට ප්‍රවේශවීම පාලනය කළ හැකි වීම.

iii. 2024 අංක 9 දරන මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතභාවය පිළිබඳ පනත සංශෝධනය කිරීම මගින් මාර්ගගත ක්‍රම ඔස්සේ දුම්කොළ නිෂ්පාදන, මද්‍යසාර සහ මත්ද්‍රව්‍ය ප්‍රවර්ධනය කිරීම වැළැක්වීමට හැකි වීම.

iv. මත්ද්‍රව්‍ය ප්‍රවර්ධනයට එරෙහිව දේශීයව ඇති නෛතික ප්‍රතිපාදනයන්ට එරෙහිව යමින් අන්තර්ජාලය හරහා සිදු කරන ප්‍රවර්ධනය සහ වෙළෙඳාම් කටයුතු හඳුනා ගැනීමටත්, ඒවා නියාමනය කිරීමට හා ප්‍රතිචාර දැක්වීමට සුදුසු යාන්ත්‍රණයක් විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව හරහා ස්ථාපනය කිරීම

v. මත්ද්‍රව්‍ය පිළිබඳව තොරතුරු සැපයීම පිළිබඳව මාධ්‍ය ආයතන වෙත අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය මගින් මාර්ගෝපදේශයක් සැපයීම. යම් හෙයකින් එවැනි මාර්ගෝපදේශ උල්ලංඝනය කරන්නේ නම් ඊට එරෙහිව පියවර ගත හැකි ආකාරයට දුම්කොළ සහ මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය සහ අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය පනත් සංශෝධනය කිරීම.

vi. මත්ද්‍රව්‍ය ප්‍රවර්ධනය සම්බන්ධයෙන් මාධ්‍ය මගින් සිදු කරන වැරදි වැළැක්වීම සඳහා නියමිත මාර්ගෝපදේශ නිරන්තරයෙන් සමාලෝචනය කරමින් යාවත්කාලීන කිරීම.

vii. මද්‍යසාර, දුම්කොළ ඇතුළු අනෙකුත් මත්ද්‍රව්‍ය භාවිතයේ හානිය සහ මත්ද්‍රව්‍ය සඳහා දරුවන් යොමු කරවා ගැනීම පිණිස යොදාගන්නා කූඨ උපක්‍රම පිළිබඳව දැනුවත් කිරීමේ පණිවිඩයක් ළමුන් සහ තරුණ පරපුර වෙත වඩා හොඳින් සමීප කළ හැකි ජාතික වශයෙන් සංවිධානය වූ ප්‍රතිප්‍රචාරක ව්‍යාපාරයක්, රාජ්‍ය සහ පෞද්ගලික මාධ්‍ය මෙන්ම සමාජ මාධ්‍ය හරහා හඳුන්වාදීමට කටයුතු කිරීම.

viii. මද්‍යසාර, දුම්වැටි හෝ මත්ද්‍රව්‍යවලට අදාළව නිවැරදි තොරතුරු සන්නිවේදනය නොවීම තුළින් සහ වැරදි මත සමාජගත වීම සහ ඒවා සමාජ මාධ්‍ය හරහා අනවශ්‍ය අන්දමින් ප්‍රචාරණය වීම වැළැක්වීම සඳහා ජනමාධ්‍යවේදීන් දැනුවත් කිරීමේ වැඩසටහන් විධිමත් කාල රාමුවකට අනුව අඛණ්ඩව පැවැත්වීම.

ix. මත්ද්‍රව්‍ය, දුම්කොළ නිෂ්පාදන සහ මද්‍යසාර සම්බන්ධ කටයුතුවලදී ජනමාධ්‍ය ක්‍රියා කළ යුතු ආකාරය පිළිබඳව උපදෙස් සංග්‍රහයක් සකස් කර, ඒ පිළිබඳව මාධ්‍යවේදීන් දැනුවත් කිරීමේ වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කිරීම සහ ඊට අදාළ වගකීම දුම්කොළ සහ මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය සහ අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය වෙත පැවරීම.

## 1.3 <u>රාජ්‍ය ආයතනවල වගකීම</u>

i. දුම්වැටි සහ මද්‍යසාර භාවිතය අවම කිරීම අරමුණු කරගෙන විද්‍යාත්මක මිල සූත්‍රයකට අනුව, 80% කට නොඅඩු බදු ආදායමක් රජයට ලැබෙන පරිදි බදු පැනවීම සඳහා ක්‍රමවේදයක් විනිවිදභාවය සහිතව හඳුන්වාදීම සහ ඊට අනුව බදු පැනවීම.

ii. තවද, දුම්වැටි සහ මද්‍යසාර සමාගම් විසින් ලබා දෙන එම ආයතන පිළිබඳ දෝෂ සහිත වාර්තා හේතුවෙන් රජයට විශාල බදු ආදායමක් අහිමි වන බැවින් එය වැළැක්වීම සඳහා ලෝක සෞඛ්‍ය සංවිධානය විසින් හඳුන්වාදී ඇති ක්‍රමවේදයට අනුව විනිවිදභාවයක් සහිත යාන්ත්‍රණයක් හඳුන්වාදීම.

iii. දැනට පවතින බදු ක්‍රමයට අමතරව දුම්කොළ හා මද්‍යසාර සමාගම් වල ශුද්ධ ලාභය මත පාදක වූ හානිපූර්ණ බද්දක් අය කර ගැනීමට විධිවිධාන සැකසීම හා එමගින් අරමුදලක් පිහිටුවා මත්ද්‍රව්‍ය නිවාරණ ප්‍රතිකාර හා පුනරුත්ථාපන ක්‍රියාවලියට එම මුදල සෘජුව යෙදවීම.

iv. මත්ද්‍රව්‍ය විරෝධී රාජ්‍ය නොවන සංවිධාන සහ අදාළ රාජ්‍ය ආයතන සහයෝගයෙන් කටයුතු කිරීම දිරි ගැන්වීම සඳහා දුම්කොළ හා මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය හා අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය විසින් එම සංවිධාන ලියාපදිංචි කිරීම සහ ඊට අවශ්‍ය රාජ්‍ය අනුග්‍රහය ලබාදීම.

v. මද්‍යසාර දුම්වැටි හා මත්ද්‍රව්‍ය සඳහා කෘත්‍රිමව නිර්මාණය කරනු ලබන ඉල්ලුම අවම කිරීම පිණිස සමාජය තුළින් එම ඉල්ලුම නිර්මාණය කිරීමේ ක්‍රියාවලියට එරෙහිව ප්‍රබල මතයක් ගොඩනැංවීම වෙනුවෙන් සමාජ ක්‍රියාකාරීන් හට අවශ්‍ය අනුග්‍රහය සහ අනුබලය ලබා දීම.

vi. සුරාබදු දෙපාර්තමේන්තුවට අනුව නොගෙවා හරින ලද මද්‍යසාර බදු මුදල් රජයට අයකර ගැනීම සඳහා විශේෂ විධිවිධාන සහිත පනතක් සම්මත කිරීම.

vii. දුම්කොළ හා මද්‍යසාර බදු ගෙවීම් පැහැර හැරීම සහ වංචා කිරීම සාපරාධී වරදක් බවට පත් කිරීම සඳහා අදාළ පනත් සංශෝධනය කිරීම. තවද, දුම්කොළ හා මද්‍යසාර නිෂ්පාදනය හා බෙදා හැරීම පිළිබඳව ලුහු බැඳීම සහ සොයා ගැනීම සම්බන්ධයෙන් (track & tracing) මහජනතාව ද දැනුවත් වන ආකාරයේ පාරදෘශ්‍ය ක්‍රමවේදයක් හඳුන්වා දීම සහ ඊට අදාළව තොරතුරු ලබා දෙන්නන් ආරක්ෂා කිරීම සහ දිරි ගැන්වීම සඳහා ක්‍රමවේදයක් සැකසීම.

### 1.4 <u>මත්ද්‍රව්‍ය නිවාරණය</u>

#### 1.4.1 <u>රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතනවල මැදිහත්වීම</u>

i. නිවාරණ ක්‍රියාවලියේදී මද්‍යසාර, දුම්කොළ හා මත්ද්‍රව්‍ය සම්බන්ධයෙන් නිර්මාණය කරනු ලබන ආකර්ෂණීය ප්‍රතිරූපය සහ ඉල්ලුම අවම කිරීම සහ ශුන්‍ය කිරීමට මූලිකත්වය දෙමින් අනෙකුත් ක්‍රියාකාරකම් ඒ වටා ගොනු කිරීම.

ii. මද්‍යසාර, දුම්කොළ සහ මත්ද්‍රව්‍ය නිවාරණය ප්‍රතිකාරය, පුනරුත්ථාපනය සහ සමාජගත කිරීම සම්බන්ධයෙන් සමාජ වගකීම ප්‍රවර්ධනය කිරීමට අවශ්‍ය සමාජ මනෝභාවය නිර්මාණය කිරීම සඳහා සියලු රාජ්‍ය ආයතන හා රාජ්‍ය නොවන ආයතන ඒකාබද්ධව කටයුතු කිරීම.

iii. ප්‍රජා පාදක මත්ද්‍රව්‍ය නිවාරණ මැදිහත්වීම් වලදී අවදානම් සහිත කණ්ඩායම් (නිදසුනක් ලෙස මව විදේශ ගතවූ පවුල්වල දරුවන්, මව හෝ පියා බන්ධනාගාරතවූවන්ගේ පවුල්) පිළිබඳ විශේෂ අවධානයක් යොමු කර විශේෂ ප්‍රවේශයකින් ක්‍රියාත්මක විය යුතු ය. අවදානම් සහිත කණ්ඩායම් හඳුනාගැනීමේ තක්සේරු ක්‍රමවේදයන් ශක්තිමත් කරමින් ක්‍රියාත්මක තත්ත්වයට යොමු කළ යුතු ය.

iv. මත්ද්‍රව්‍ය නිවාරණ ප්‍රවේශයේදී කේන්ද්‍රස්ථානය ප්‍රජාව වියයුතු අතර, එම ප්‍රජාවේ සම්පත් හා ශක්තිය උපයෝගී කර ගනිමින් බල ගැන්වීම සිදු කළ යුතුය. තවද, ප්‍රජාව විසින්ම නිර්මාණය කරන දර්ශක මගින් වැඩසටහනේ ප්‍රගතිය මැනීමේ වගකීමද ප්‍රජාව සතු විය යුතු ය. මෙම ප්‍රජා ප්‍රවේශය සඳහා පහසුකම් සැලසීම හා සම්බන්ධීකරණය ක්ෂේත්‍ර නිලධාරීන් මගින් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ මූලිකත්වයෙන් සිදු කළ යුතුය.

v. ප්‍රජා මට්ටමින් මත්ද්‍රව්‍ය නිවාරණ කටයුතු සහ මත්ද්‍රව්‍ය නිවාරණය සඳහා සමාජ මනෝභාවය ගොඩ නැගීමට දායක වන පුද්ගලයන් සහ සංවිධාන ඇගයීමට ලක් කිරීම

vi. සංස්කෘතික උත්සව, මහජන ඒකරාශීවීම් වැනි පොදු මහජන අවකාශයන් භාවිත කරමින් මද්‍යසාර දුම්වැටි ඇතුළු මත්ද්‍රව්‍ය නිවාරණ පණිවුඩ සමාජගත කිරීම අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය සහ දුම්කොළ සහ මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරි පනත යටතේ සිටින බලයලත් නිලධාරීන්ගේ වගකීම විය යුතු ය.

vii. රාජ්‍ය නිලධාරීන්, සෞඛ්‍ය ක්ෂේත්‍රයට අයත් නිලධාරීන්, නීතිය ක්‍රියාත්මක කරන අංශවලට අයත් නිලධාරීන් සහ විශේෂයෙන් ක්ෂේත්‍ර නිලධාරීන් මත්ද්‍රව්‍ය නිවාරණය පිළිබඳ පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශය, අධ්‍යාපන අමාත්‍යාංශය, ප්‍රජා පොලිස් ඒකක, සහ දුම්කොළ සහ මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය යන ආයතන සම්බන්ධීකරණය කිරීම අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ වගකීම වේ.

viii. ග්‍රාම නිලධාරී වසම් මට්ටමෙන් විවිධ විෂයයන් සම්බන්ධයෙන් කටයුතු කරන රාජ්‍ය නිලධාරීන්ගේ සේවය මත්ද්‍රව්‍ය නිවාරණ කටයුතු සඳහා ලබා ගැනීමට හැකිවන පරිදි ඔවුන්ගේ විෂය පථයට ඒ සම්බන්ධ වගකීම් ඇතුළත් කිරීම සහ ඔවුන්ට අවශ්‍ය තාක්ෂණික පුහුණුව ලබා දීම. මෙම නිලධාරීන්ගේ මග පෙන්වීම යටතේ ග්‍රාමීයව ක්‍රියාත්මක වන ස්වේච්ඡා සංවිධානවල හා ප්‍රජා නායක නායිකාවන්ගේ සහභාගීත්වයෙන් ග්‍රාමීය මත්ද්‍රව්‍ය නිවාරණ කමිටු ස්ථාපිත විය යුතු අතර, එමගින් ප්‍රජාව තුළ මත්ද්‍රව්‍ය නිවාරණ හා ප්‍රතිකාර ක්‍රමවේදයන් සම්බන්ධීකරණය කර ක්රියාත්මක කළ යුතු ය. එහි ප්‍රගතිය ප්‍රාදේශීය ලේකම් වෙත වාර්තා කර අදාළ ආයතන වෙතට ඉදිරිපත් කළ යුතු අතර, එහි සාරාංශයක් අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය වෙතද ඉදිරිපත් කළ යුතුය. ඉහත ප්‍රජා ක්‍රියාවලිය ආවේක්ෂණය හා අධීක්ෂණය කිරීම අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ වගකීම වන්නේ ය.

ix. ප්‍රජා පාදක මත්ද්‍රව්‍ය නිවාරණයේදී පවුල් ඒකකයක ජීවත්වන පුද්ගලයන් අතර සම්බන්ධතාවය වර්ධනය කිරීම සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම මගින් පුද්ගලයන් මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වීමට ඇති ප්‍රවණතාවයන් අවම කිරීම.

x. ප්‍රජා පාදක මත්ද්‍රව්‍ය ප්‍රතිකාර ක්‍රමවේද අනුගමනය කිරීමේදී එක්ව කටයුතු කරන කණ්ඩායම් (peer groups) සඳහා අවශ්‍ය අවබෝධය ලබා දීමෙන් පසු එම ක්‍රමවේදය උපයෝගී කර ගැනීමට අවශ්‍ය වාතාවරණය සැකසිය යුතු ය.

xi. සිවිල් සංවිධාන සහ ප්‍රජා මට්ටමේ ක්‍රියාකාරී කණ්ඩායම්වල දායකත්වය මත්ද්‍රව්‍ය නිවාරණ සහ ප්‍රතිකාර ආශ්‍රිත ක්‍රියාකාරකම් සඳහා ලබා ගැනීම දිස්ත්‍රික් ප්‍රාදේශීය හා ග්‍රාමීය මට්ටමින්ද සිදු විය යුතු ය.

xii. මත්ද්‍රව්‍ය ඇබ්බැහිකාරීත්වයට ලක්වූවන් සඳහා බන්ධනාගාර ගතවීමේදී ඔවුන් සඳහා ප්‍රතිකාර සේවාවන් ලබා දීමේ ක්‍රියාවලිය විධිමත් කිරීම සහ ඒ සඳහා පුහුණුව ලත් නිලධාරීන් යෙදවීම.

xiii. මත්ද්‍රව්‍ය ආශ්‍රිත වැරදි සඳහා බන්ධනාගාරගත වූවන් සම්බන්ධයෙන් ජෛව විද්‍යාත්මක සහ මනෝවිද්‍යාත්මක අනාවරණ පරීක්ෂාවන් සිදු කර, එම ප්‍රතිඵල මත ඔවුන් පුනරුත්ථාපන සහ ප්‍රතිකාර සේවාවන් සහිත මධ්‍යස්ථාන කරා යොමු කිරීම.

xiv. සුළු පරිමාණ මද්‍යසාර සහ මත්ද්‍රව්‍ය වැරදි සඳහා අත්අඩංගුවට පත්වන්නන් බන්ධනාගාර ගත කිරීම වෙනුවට ප්‍රජා විශෝධන නියෝග යටතේ ප්‍රජා පාදක විශෝධන ක්‍රියාවලියකට යටත් කොට නැවත සමාජගත කිරීම.

xv. මත්ද්‍රව්‍යවලින් නිදහස් වීමේදී පුද්ගලයන් දක්වන සංකූලතාවයන් සඳහා සුදුසු ප්‍රතිකර්ම ලබා දිය හැකි මධ්‍යස්ථාන ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තුව යටතේ ස්ථාපනය කිරීම.

xvi. මත්ද්‍රව්‍ය භාවිතයෙන් නිදහස් වූ පුද්ගලයන් ඇතුළත් කරමින් සකස් කරන ලද ස්වයං උපකාරක කණ්ඩායම් මාර්ගයෙන් මත්ද්‍රව්‍ය භාවිත කරන පුද්ගලයන්ට එයින් නිදහස් වීම සඳහා අවශ්‍ය සහයෝගය ලබා දීමට කටයුතු කිරීම.

xvii. මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වූවන් වෙනුවෙන් දියුණු ප්‍රාථමික ප්‍රතිකාර සේවාවන් ස්ථාපනය කිරීම. මත්ද්‍රව්‍ය භාවිතය සම්බන්ධයෙන් වර්තමානයේ පවතින තත්වයන්ට ගැලපෙන පරිදි සහ සමාජයේ සියලුම මට්ටම්වල පුද්ගලයින්ට වඩා ගුණාත්මක සේවාවක් පහසුවෙන් ලබා ගැනීමට හැකිවන පරිදි රාජ්‍ය/රාජ්‍ය නොවන සේවා මධ්‍යස්ථාන පවත්වාගෙන යාම.

xviii. මත්ද්‍රව්‍ය භාවිත කරන්නන් අතර සිටින වෙනත් රෝගී තත්වයන් ඇති පිරිස් හඳුනා ගැනීමට හා ඔවුන්ගේ අවශ්‍යතාවයන්ට සරිලන පරිදි ප්‍රතිකාර සේවාවන් ලබා දීම සඳහා සෞඛ්‍ය පද්ධතිය තුළ සුදුසු සමායෝජනයන් සිදු කිරීම.

xix. නැවත නැවත පුනරුත්ථාපන ක්‍රියාවලියට යොමු වන්නන් සඳහා සුවිශේෂී ප්‍රතිකාර සහ පුනරුත්ථාපන මධ්‍යස්ථාන ස්ථාපිත කිරීම හෝ දැනට පවතින මධ්‍යස්ථාන එකී තත්ත්වයට පරිවර්ථනය කිරීම.

## 2. මත් ද්‍රව්‍ය සැපයුම පාලනය කිරීම

### 2.1 ශක්තිමත් ආරක්ෂක වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කිරීම

i. මත්ද්‍රව්‍ය සැපයුම පාලනය කිරීමට අදාළව රටේ පවතින නීතිය නිසි ලෙස ක්‍රියාත්මක කිරීම පිළිබඳව අධීක්ෂණය කිරීම සඳහාත් අවශ්‍ය නෛතික සංශෝධනයන් සිදු කොට ක්‍රියාත්මක කිරීම සඳහාත් ශ්‍රී ලංකා පොලීසිය, සුරාබදු දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා රේගුව, තැපැල් දෙපාර්තමේන්තුව, විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව, පුනරුත්ථාපන කාර්යාංශය, වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව, අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය සහ දුම්කොළ සහ මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය, නාවික හමුදාව, නීතිපති දෙපාර්තමේන්තුව, බන්ධනාගාර දෙපාර්තමේන්තුව, ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තුව යන ආයතනවල සහභාගීත්වයෙන් අනුකමිටුවක් ස්ථාපනය කිරීම.

ii. මත්ද්‍රව්‍ය වැටලීම් සඳහා පොලිස් දෙපාර්තමේන්තුවට හා අනෙකුත් නීති ක්‍රියාත්මක කරන ආයතන සඳහා අවශ්‍ය මානව සම්පත හා අනෙකුත් පහසුකම් කඩිනමින් ලබා දීම.

iii. මත්ද්‍රව්‍ය මර්දනය සඳහා අදාළ ආයතන සියල්ල ඒකාබද්ධ වෙමින් උපායමාර්ගික සැලැස්මකට අනුව ක්‍රියාත්මක වීම.

iv. පාර්සල් තැපැල (Parcel Post) හරහා ලැබෙන භාණ්ඩ සම්බන්ධයෙන් ආරක්ෂිත ක්‍රමවේදයක් හඳුන්වාදීම වෙනුවෙන් තාක්ෂණික යාන්ත්‍රණයක් ශ්‍රී ලංකා රේගුව සහ තැපැල් දෙපාර්තමේන්තුව මගින් ඒකාබද්ධව සකස් කිරීම.

v. මත්ද්‍රව්‍ය සම්බන්ධ නීතිය ක්‍රියාත්මක කරන සියලු ආයතන ඒකාබද්ධ වූ විශේෂ මෙහෙයුම් ඒකකයක් පිහිටුවීම.

vi. මත් ද්‍රව්‍යවලට එරෙහිව නීතිය ක්‍රියාත්මක කරන සියලුම ආයතනවල ක්‍රියාකාරකම් සම්බන්ධීකරණය කිරීමට හා ඒ සඳහා සහායවීමට එකී ආයතන සඳහා විශේෂිත වූ ක්‍රමවේදයක් හඳුන්වා දීම සහ එවැනි අංශ අතර තොරතුරු පහසුවෙන් හුවමාරු කර ගැනීම සඳහා එම ආයතනවල නියෝජිතයින්ගෙන් සැදුම්ලත් මෙහෙයුම් කමිටුවක් පොලිස් මත්ද්‍රව්‍ය නාශක කාර්යාංශයේ මූලිකත්වයෙන් ස්ථාපිත කිරීම.

vii. මුහුදු මාර්ගයෙන් රට තුළට මත්ද්‍රව්‍ය ගෙන ඒම අවම කිරීම සහ වැළැක්වීමට අවශ්‍ය වන පරිදි පිරිස් බලය, තාක්ෂණය හා යාත්‍රා සපයමින් වෙරළාරක්ෂක දෙපාර්තමේන්තුව කඩිනමින් ශක්තිමත් කිරීම.

viii. වෙරළාරක්ෂක දෙපාර්තමේන්තුව සහ ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව ඒකාබද්ධව ධීවරයන් මුහුදු ගමන් සඳහා පිටත්වන ස්ථාන සියල්ලම ආවරණය වන පරිදි නිරීක්ෂණ කටයුතු සිදු කිරීම හා වෙරළාසන්න මුර සංචාරක කටයුතු සිදු කරනු ලබන වාර ගණන වැඩිකිරීම

ix. ධීවර යාත්‍රා හා අනෙකුත් යාත්‍රා අලුතින් මිල දී ගැනීමේ දී සහ අයිතිය වෙනත් පාර්ශ්වයකට පැවරීමේ දී එම යාත්‍රාවල නව හිමිකරුවන් සම්බන්ධව ආරක්ෂක අමාත්‍යංශයේ අනුමැතියක් ලබා ගැනීම අනිවාර්ය කිරීම

x. සියලු මුහුදු යාත්‍රා නිරීක්ෂණය කිරීම සඳහා නාවික හමුදාවට සහ වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුවට අධි බලැති තාක්ෂණික පද්ධතියක් ලබා දීම හා එය අවශ්‍ය අවස්ථාවලදී යාවත්කාලීන කිරීම.

xi. සෑම ධීවර වරායක් ආශ්‍රිතවම ඇඟිලි සලකුණු සටහන් ලබාගැනීමේ පද්ධතියක් හෝ මුහුණු හඳුනාගැනීමේ පහසුකම් (facial recognition) සහිත යන්ත්‍ර සහ CCTV කැමරා පද්ධතියක් ස්ථාපනය කිරීමට කටයුතු කිරීම.

xii. අන්තර්ජාතික ගුවන් තොටුපොළවල මෙන්ම ඒ ආශ්‍රිත ගුවන් බඩු අංශයේ ද (Air Cargo) CCTV කැමරා පද්ධතිය වෙත පිවිසීමේ හා පාලනය කිරීමේ බලය රේගු නිලධාරීන්ට ලබා දීම.

xiii. වරාය පරිශ්‍රයන් තුළ ශ්‍රී ලංකා රේගුව සහ වරාය අධිකාරිය භාරයේ පවතින බහාළුම් පරිලෝකනය (Scan) කිරීමේ පහසුකම් වැඩි දියුණු කිරීම සහ විශේෂයෙන් පුහුණු කරන ලද පොලිස් නිල සුනඛයන් ශ්‍රී ලංකා රේගුවේ සහ වරාය අධිකාරියේ භාණ්ඩ පරීක්ෂණ රාජකාරි සඳහා යෙදවීම.

xiv. නීතිය ක්‍රියාත්මක කරනු ලබන ආයතන විසින් අත්අඩංගුවට ගනු ලබන නඩු භාණ්ඩ මුද්‍රා තැබීම සඳහා ඒ සෑම ආයතනයකටම පොදුවේ භාවිත කළ හැකි අනුක්‍රමික අංක සහ QR කේත සහිත නවීන ආරක්ෂිත ක්‍රමවේදයක් හඳුන්වා දීම.

xv. මත්ද්‍රව්‍ය පහසුවෙන් සොයාගත හැකි, සොයා ගැනීම පහසු නොවන සහ සොයාගත නොහැකි වශයෙන් පොලිස් වසම් වර්ගීකරණය කිරීම සහ රට තුළ විවිධ ප්‍රදේශවල මත්ද්‍රව්‍ය මිල දී ගැනීමේ හැකියාව පිළිබඳව නිරතුරුව අවධානයෙන් පසුවීම.

xvi. පොලිස් නිලධාරීන්ගේ පැතිකඩ (profile) සකස් කිරීම සඳහා මෙන්ම ඔවුන්ගේ උසස්වීම් සහ වැටුප් වර්ධක ලබා දීමේදී ඔවුන් සේවය කළ පොලිස් වසම්වල මත්ද්‍රව්‍ය සුලබතාවයේ වෙනස දර්ශකයක් ලෙස යොදා ගැනීම.

xvii. වයස අවුරුදු 21ට අඩු පුද්ගලයන් හට දුම්කොළ හා මද්‍යසාර නිෂ්පාදන අලෙවි කිරීම තහනම් කර තිබෙන නමුත්, එම නීතිය තදින් ක්‍රියාත්මක නොවන බැවින්, එම නීතිය නිසි පරිදි ක්‍රියාත්මක කිරීමට කටයුතු කිරීම.
*(2006 අංක 26 දරන දුම්කොළ හා මධ්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය පනතේ 31 වැනි වගන්තිය)*

xviii. නීතිය ක්‍රියාත්මක කරන සියලු ක්ෂේත්‍ර නිලධාරීන් හට මත්ද්‍රව්‍ය හඳුනා ගැනීම සඳහා අවශ්‍ය පුහුණුවීම් සහ නවීන තාක්ෂණික මෙවලම් ලබා දීම.

xix. මත්ද්‍රව්‍ය වැරදි හා සම්බන්ධ විමර්ශන කටයුතු ක්‍රියාත්මක කිරීමේ දී පොලිස් දෙපාර්තමේන්තුව ඇතුළු නීතිය ක්‍රියාත්මක කරනු ලබන ආයතන විසින් අනුගමනය කළ යුතු සම්මත ක්‍රියා පටිපාටියක් Standard Operation Procedure (S.O.P) නීතිපති දෙපාර්තමේන්තුව මගින් කඩිනමින් හඳුන්වා දීම.

xx. ධීවර යාත්‍රා අලුතින් නිෂ්පාදනය කිරීමේ දී සහ ඒවා හිමිකරුවන් වෙත භාරදීම පිළිබඳව පොලිස් දෙපාර්තමේන්තුව සහ ධීවර අමාත්‍යාංශය සතු තොරතුරු ධීවර සහ ජලජ සම්පත් දෙපාර්තමේන්තුව මගින් ශ්‍රී ලංකා නාවික හමුදාව සහ ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව වෙත වාර්තා කිරීමට සහ නිර්දේශ ලබාගැනීමට ක්‍රමවේදයක් හඳුන්වා දීම.

xxi. එක් දින කුඩා ධීවර යාත්‍රාවල ගමන් මාර්ගය හඳුනා ගැනීම (tracking) සඳහා අඩු වියදම් සහිත ක්‍රමවේදයක් හඳුන්වා දීම

xxii. සෑම ධීවර වරායකම පහසුකම් සහිත වෙරළාරක්ෂක අනුඛණ්ඩ ස්ථාපනය කිරීම

xxiii. මුහුදු ගමන් සඳහා පිටත්වන සියලුම යාත්‍රා පිළිබඳ විස්තර නාවික හමුදාව, පොලිස් මත්ද්‍රව්‍ය නාශක කාර්යාංශය සහ අනෙකුත් නීතිය ක්‍රියාත්මක කරන ආයතන අතර හුවමාරු කර ගැනීම සඳහා පහසුකම් සැලසීම.

xxiv. කුඩා යාත්‍රා ගොඩබිමට පැමිණෙන ස්ථාන නියාමනය කිරීම සඳහා ක්‍රමවේදයක් හඳුන්වා දීම. එවැනි ස්ථාන ලියාපදිංචි කිරීම සහ ගැසට් මගින් ප්‍රකාශයට පත් කිරීම. වෙරළාරක්ෂක මුර පොළවල් එම ස්ථාන ආශ්‍රිතව ස්ථාපනය කිරීම

xxv. මත්ද්‍රව්‍ය නිෂ්පාදනයේ සහ භාවිතයේ නව ප්‍රවණතාවයන් හඳුනා ගැනීම සඳහා පර්යේෂණ සහ අධ්‍යයනයන් නිරන්තරයෙන් සිදු කිරීම. මෙයට අදාළව අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය විසින් පර්යේෂණ න්‍යාය පත්‍රයක් ප්‍රසිද්ධියට පත් කිරීම සහ එවැනි හඳුනා ගන්නා ලද මත්ද්‍රව්‍ය පාලනය සඳහා කඩිනමින් නීති යාවත්කාලීන කිරීම.

xxvi. මත්ද්‍රව්‍ය ක්‍රියාකාරකම් බහුලව පවතින බවට හඳුනාගෙන ඇති ප්‍රදේශ ඇතුළත් භූගෝලීය දත්ත පද්ධතියක් හඳුන්වා දීම සහ මත්ද්‍රව්‍ය සම්බන්ධ ක්‍රියාකාරකම් බහුල ප්‍රදේශ එම පද්ධතිය මගින් හඳුනා ගැනීමට කටයුතු කිරීම සහ එවැනි ප්‍රදේශ කෙරෙහි ප්‍රමුඛ අවධානය යොමු කිරීම. ඒ සඳහා සුරාබදු දෙපාර්තමේන්තුව සහ අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයෙන්ද ලබා ගන්නා තොරතුරු මත පොලිස් මත්ද්‍රව්‍ය නාශක කාර්යාංශය විසින් අදාළ සිතියම්ගත කිරීම සිදු කළ යුතු ය. එම තොරතුරු අවම වශයෙන් මාස 06කට වරක් හෝ යාවත්කාලීන කිරීම.

xxvii. මත්ද්‍රව්‍ය වැටලීම් සඳහා නිවැරදි තොරතුරු ලබා දෙන පුද්ගලයන් වෙත ආකර්ෂණීය දීමනා ලබා දීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන වෙන් කිරීම සහ එවැනි පුද්ගලයන්ගේ ආරක්ෂාව තහවුරු කිරීම මෙන්ම අවශ්‍ය අවස්ථාවන්හි දී ඔවුන්ට විදේශගත වීම සඳහා පහසුකම් සලසා දීම.

## 2.2 <u>යාවත්කාලීන වූ තාක්ෂණික ක්‍රමවේදයන් සහ තොරතුරු භාවිත කිරීම</u>

i. සිම්පත් නිකුත් කිරීමේදී එක් ජාතික හැඳුනුම්පත් අංකයක් යටතේ සියලුම දූරකථන සමාගම් වලින් ලබාගත හැකි උපරිම සිම්පත් ප්‍රමාණය 05කට සීමා කිරීම (සිම්පත් 05කට වඩා ලබා ගන්නා අවස්ථාවලදී විශේෂ අවසරයක් යටතේ ලබා ගත හැකිවීම) හා පොලීසිය හෝ බලය ලත් නිලධාරියකු විසින් දූරකථනය පරීක්ෂා කිරීමේදී සිම්පත සන්තකය දරන්නාගේ අනන්‍යතාවය තහවුරු කිරීමට බැඳී සිටින ආකාරයට විදුලි සංදේශ නියාමන කොමිෂන් සභා පනත යටතේ රෙගුලාසි නිකුත් කිරීම. දූරකථන සමාගම් විසින් සිම්පත් නිකුත් කිරීමේදී A.P.I (Application Protocol Interface) පරීක්ෂණයෙන් පසුව සිම්පත නිකුත් කිරීමට කටයුතු කිරීම සඳහා මෙන්ම අන්තර්ජාල යෙදවුම් (වට්ස්ඇප්,වයිබර්,ඉමෝ ආදී) සැකසීමට ලබාගන්නා වූ සිම්පතේ අනන්‍යතාවය තමාගේ බවට තහවුරු කිරීමට භාවිත කරන්නා සමත්විය යුතු බවට නීතිමය ප්‍රතිපාදන පැනවීම.

ii. සොරකම් කරන ලද හෝ මිය ගිය පුද්ගලයන්ගේ ජාතික හැඳුනුම්පත් භාවිතයෙන් සිම් පත් ලබා ගැනීම වැළැක්වීම පිණිස සිම් පත ලබා ගන්නා පුද්ගලයාගේ අනන්‍යතාවය එය ලබා දීමට පෙර අනිවාර්යයයෙන් තහවුරු කර ගැනීම. මියගිය පුද්ගලයන්ගේ ජාතික හැඳුනුම්පත් තොරතුරු ප්‍රමුඛතාවයෙන් යුතුව විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවට ලබාදීම, ප්‍රාදේශීය ලේකම්වරයාගේ විශේෂිත වගකීමක් ලෙස ප්‍රතිපාදන පැනවීම.

iii. ජංගම දුරකථන ආශ්‍රිත මුදල් හුවමාරු(eZ cash, M cash වැනි) ක්‍රමවේද යටතේ සිදුවන ගනුදෙනු හඳුනා ගැනීමේ ක්‍රමවේදයක් තම පරිගණක පද්ධති තුළ පවත්වා ගැනීම සඳහා සහ සැක කටයුතු ගනුදෙනු පිළිබඳව නීතිය ක්‍රියාත්මක කිරීමේ ආයතනවලට වාර්තා කිරීම සඳහා අදාළ දුරකථන සමාගම්වලට නෛතික බැඳීමක් ඇති කිරීම.

iv. බන්ධනාගාරවල සිට ජාවාරම් සිදු කරන පුද්ගලයන්ට දුරකථන භාවිත කළ නොහැකි වන අයුරින් බන්ධනාගාර තාක්ෂණික වශයෙන් යාවත්කාලීන කිරීම.

v. හඳුනාගත් මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවන් රඳවා තබා ගැනීමේදී සහ සිර දඬුවම් පැමිණවීමේදී සාමාන්‍ය ජනාකීර්ණ ප්‍රදේශ වලින් වෙන් වූ විශේෂිත බන්ධනාගාර පද්ධතියක් (දූපතක් වැනි ස්ථානයක) ස්ථාපනය කිරීම. තවද, එකී රැඳවියන් අන්තර් සම්බන්ධතාවයන් පැවැත්විය නොහැකි ආකාරයෙන් වෙන් වෙන්ව තැබීම.

vi. ගුවන් තොටුපළවල් සහ වරායවලින් රටින් පිටවන/ඇතුළුවන ජාවාරම්කරුවන් හඳුනා ගැනීම පහසුවන පරිදි ජෛවමිතික දත්ත (Bio Matrix) මත පදනම් වූ උසස් තාක්ෂණික උපක්‍රම ක්‍රියාත්මක කිරීම කඩිනම් කිරීම. තවද, මෙම ක්‍රියාවලිය සාර්ථක කර ගැනීම සඳහා ප්‍රත්‍යන්ත අවදානම් ඇගයීමේ මධ්‍යස්ථානය (Boarder Risk Assessment Centre) ආයතනයේ සහාය ලබා ගැනීම.

vii. මත්ද්‍රව්‍ය භාවිත කර සිටින පුද්ගලයන් හඳුනා ගැනීම සඳහා ද උසස්/නවීන තාක්ෂණික ක්‍රමවේද හඳුන්වා දීම. නවතම මත්ද්‍රව්‍ය වර්ග හඳුනා ගැනීමට හැකිවන පරිදි ක්ෂේත්‍රයේදී භාවිත කරන පරීක්ෂණ කට්ටල යාවත්කාලීන කිරීම.

viii. ජාත්‍යන්තර වශයෙන් මත්ද්‍රව්‍ය නිවාරණයට අදාළ වැඩමුළු සහ සම්මන්ත්‍රණ සඳහා සහභාගී වන නිලධාරීන් එකී සම්මන්ත්‍රණ වලදී එළැඹෙන එකඟතාවයන් සම්බන්ධයෙන් අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය සහ රජයේ අනෙකුත් වගකිවයුතු ආයතන දැනුවත් කර, ඊට අදාළ අවබෝධතා ගිවිසුම් සම්මුතීන්, ප්‍රඥප්තීන් වලට එළැඹීම සඳහා ඉදිරි ක්‍රියාමාර්ග ගැනීම සම්බන්ධයෙන් පියවර ගැනීම.

ix. රියැදුරන් මත්ද්‍රව්‍ය භාවිතය සිදු කර ඇත්දැයි අහඹු ලෙස පරීක්ෂා කිරීම අඛණ්ඩව සිදු කිරීම සඳහා මූලික අනාවරණ පරීක්ෂාව අවම වශයෙන් මත්ද්‍රව්‍ය 12 ක් හඳුනා ගැනීමේ පරීක්ෂණ කට්ටලයකින් සිදුකර, ඉන් අනතුරුව අධිකරණ වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කිරීමට කටයුතු කර නීතිමය පියවර ගැනීම.

## 2.3. <u>නෛතික සීමාවන් පුළුල් කිරීම සහ දණ්ඩනයන්</u>

i. කංසා වගාව, භාවිතය, නීතිගත කිරීම වැළැක්වීම සහ කංසා සම්බන්ධ නීතිරීති දැඩි කිරීම

ii. අත් අඩංගුවට ගන්නා මත්ද්‍රව්‍ය වරදකරුවන් හට කඩිනමින් නඩු පැවරීම සඳහා කටයුතු කිරීම

iii. මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවන්ට ජීවිතාන්තය දක්වා ලබා දෙන සිර දඬුවම් සමාවක් ලබා දීමකින් තොරව සම්පූර්ණයෙන් ක්‍රියාත්මක කිරීම.

iv. මත්ද්‍රව්‍ය නිවාරණය පිළිබඳ ජනාධිපති කාර්ය සාධක බලකාය විසින් හඳුනාගෙන ඇති පරිදි සිදු කිරීමට අවශ්‍ය නෛතික ප්‍රතිසංස්කරණ සහ නෛතික බලගැන්වීම් කඩිනම් කිරීම.

a) මහ මුහුදේදී මත්ද්‍රව්‍ය වැරදි සම්බන්ධයෙන් විදේශිකයන් අත්අඩංගුවට ගන්නා අවස්ථාවලදී ඔවුන්ට අදාළ අධිකරණ බලය ලබාදීම සඳහා 1978 අංක 2 දරන අධිකරණ සංවිධාන පනත සහ 2022 අංක 41 දරන විෂ වර්ග අබිං සහ අන්තරායදායක ඖෂධ වර්ග පනත කඩිනමින් සංශෝධනය කිරීම.

b) විශේෂ විමර්ශන ක්‍රමවේද එනම්, ආවරණ මෙහෙයුම් දෘෂ්‍ය පටිගත කිරීම් රහසිගත ශ්‍රව්‍ය පටිගත කිරීම් උපාංග භාවිතය ආවේක්ෂණය සහ නිරීක්ෂණය පාලනයට නඩත්තු කර භාරදීම පිළිබඳ බලය ලබාදෙන ආකාරයේ සංශෝධනයක් අපරාධ නඩු විධාන සංග්‍රහ පනතට එකතු කිරීම ( දූෂණ විරෝධී පනතේ 55 වැනි වගන්තියට අදාළ ප්‍රතිපාදන)

c) හවුල් විමර්ශන සඳහා අවශ්‍ය නෛතික පසුබිම අපරාධ නඩු විධාන සංග්‍රහයට ඇතුළත් කිරීම.

d) සිවිල් නඩු විධාන සංග්‍රහ පනතේ 5 වැනි වගන්තියට 2023 අංක 29 දරන පනතින් සිදු කරන ලද සංශෝධනය ප්‍රකාරව "ලේඛනය" යන අර්ථ දැක්වීමට ඉලෙක්ට්‍රොනික ස්වභාවයේ ලේඛන පිළිබඳ අර්ථ නිරූපණයද අපරාධ නඩු විධාන සංග්‍රහයට ද ඇතුළත් කිරීම.

e) මත්ද්‍රව්‍ය වැරදි මගින් උපයාගත් දේපළ (Proceeds of Crime) සම්බන්ධ නීතියක් කඩිනමින් සම්මත කරගැනීම.

f) 2017 අංක 12 දරන විදේශ විනිමය පනත යටතේ අපරාධමය වගකීම නැවත ස්ථාපනය කිරීම සඳහා එකී පනතට සංශෝධනයන් සිදු කිරීම

v. බන්ධනාගාරවල තදබදයක් ඇති වීමේ තත්ත්වය සම්බන්ධයෙන් අධ්‍යයනය කිරීමෙන් අනතුරුව නිවසේ රඳවා තැබීමේ ක්‍රමවේදය (Home Detention) සඳහා සිරකරුවන් යොමු කරවීමට අවශ්‍ය නීතිමය පසුබිම සකස් කිරීම පිළිබඳව අවධානය යොමු කිරීම.

vi. ප්‍රමුඛ මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවන්ගේ දේපළ සම්බන්ධයෙන් මුදල් විශුද්ධිකරණ පනත යටතේ නීතිය ක්‍රියාත්මක කිරීම් කඩිනම් කිරීම.

vii. රජයේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුවේ නිලධාරීන් ප්‍රමාණය වැඩි කිරීම සහ අවශ්‍ය කාර්යාල, තාක්ෂණික උපකරණ සහ අනෙකුත් පහසුකම් ලබා දීම සඳහා කඩිනම් ක්‍රියාමාර්ග ගැනීම.

viii. මත්ද්‍රව්‍ය නඩු විභාග කිරීම සඳහා වෙනම අධිකරණ තෝරාගත් ස්ථානවල පිහිටුවීම මගින් මත්ද්‍රව්‍ය සම්බන්ධ නඩු කටයුතු කඩිනමින් අවසන් කිරීම, වැටලීම් සඳහා තොරතුරු ලබා දෙන පුද්ගලයන්ගේ ආරක්ෂාව සම්බන්ධයෙන් විශේෂ අවධානයක් යොමු කිරීමට කටයුතු කිරීම, යුක්තිය පසිඳලන ආයතන සහ නීතිය ක්‍රියාත්මක කරන ආයතන සම්බන්ධයෙන් සමාජය තුළ පවතින විශ්වසනීය භාවය වැඩි කිරීමට කටයුතු කිරීම සහ වරදකරුවන් වෙත නිසි දඬුවම් නියමිත පරිදි ලබා දීමට කටයුතු කිරීම මගින් මත්ද්‍රව්‍ය සම්බන්ධ වැරදි සිදු කිරීමට භීතිකාවක් ඇති කිරීමට කටයුතු කිරීම.

ix. ශ්‍රී ලංකාව තුළ පවත්වාගෙන යන පුනරුත්ථාපන මධ්‍යස්ථාන පාලනය සම්බන්ධයෙන් වන නීති සංශෝධනය කිරීම සහ නීති විරෝධී ලෙස මෙන්ම සුදුසුකම් රහිත පුද්ගලයන් විසින් පවත්වාගෙන යනු ලබන එවැනි ආයතන නියාමනය කිරීම.

x. දුම්කොළ හා මද්‍යසාර මත පැනවෙන බදු මගින් උපයා ගන්නා මුදලින් ප්‍රතිශතයක් අතිරේක ප්‍රතිපාදනයක් ලෙස සෞඛ්‍ය ක්ෂේත්‍රය වෙත සහ මත්ද්‍රව්‍ය නිවාරණය, ප්‍රතිකාරය සහ පුනරුත්ථාපන කටයුතු සඳහා රාජ්‍ය ආයතන වෙත යොමු කිරීම සහ ඉහත දැක්වෙන කටයුතු සඳහා රාජ්‍ය නොවන ආයතන වල සහයෝගය ලබා ගැනීම

xi. සිගරට් සඳහා වැඩි කරනු ලබන සිගරට් මත නිෂ්පාදන බද්දෙහි අවම අනුපාතය 75% බවට පත් කිරීම සහ එම සම්පූර්ණ ප්‍රතිලාභය භාණ්ඩාගාරයට ලැබෙන ක්‍රමවේදයක් සකස් කිරීම

xii. මද්‍යසාර අලෙවිය සඳහා තාවකාලික බලපත්‍ර ලබා දීමේදී අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලද 2016 මද්‍යසාර පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය මත සුරාබදු ආඥා පනත සංශෝධනයට ලක් කිරීම.

xiii. 2016 මධ්‍යසාර පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය අධ්‍යයනය කිරීමෙන් පසුව එයින් නෛතික තත්වයට උසස් කළ හැකි කාරණා හඳුනා ගැනීම සහ එම කාරණා නීතියක් බවට පත් කිරීමට අවශ්‍ය කටයුතු සිදු කිරීම.

xiv. මධ්‍යසාර පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය මෙන් දුම්කොළ නිෂ්පාදන පාලනය සඳහා ජාතික ප්‍රතිපත්තියක් කඩිනමින් සැකසීම.

xv. මත් උවදුර මර්දනය කිරීමේ කාර්යභාරයෙහි නියැලී සිටින ආයතන අතර ස්වයංසිද්ධ තොරතුරු හුවමාරු කර ගැනීමට හැකිවන පරිදි අදාළ අණපනත්හි සංශෝධන සිදු කිරීම.

xvi. විදේශීය සංචාරකයන් නොපැමිණෙන ප්‍රදේශවලට සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය කිරීමේ මුවාවෙන් මත්පැන් බලපත්‍ර නිකුත් කිරීම වළක්වාලීම

xvii. 2022 අංක 41 දරන විෂ වර්ග, අබිං සහ අන්තරාදායක ඖෂධ වර්ග (සංශෝධන) පනත, 1999 අංක 46 දරන ප්‍රජා පාදක විශෝධන පනත සහ 2006 අංක 27 දරන දුම්කොළ හා මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය පනත යන පනත් සඳහා කඩිනමින් අවශ්‍ය සංශෝධන සිදු කිරීම.

xviii. දුම්කොළ හා මද්‍යසාර භාවිතය අවම කිරීමේ අරමුණින් 2006 අංක 27 දරන දුම්කොළ හා මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය පනත සඳහා ඉදිරියේදී ගෙන ඒමට බලාපොරොත්තු වන පහත සඳහන් සංශෝධන කඩිනමින් සිදු කිරීම :

a. තනි දුම්වැටියක් පමණක් විකිණීම තහනම් කිරීම සඳහා වූ සංශෝධනය.

b. අධ්‍යාපන ආයතනයක සිට මීටර් 100 ක සීමාවක් ඇතුළත මද්‍යසාර හෝ දුම්වැටි විකිණීම තහනම් කිරීම සඳහා වූ සංශෝධනය

c. පොදු ස්ථාන දුම් පානයෙන් තොර කලාපයන් කිරීම සඳහා වූ සංශෝධනය. (මුහුදු වෙරළ, මහා මාර්ග සහ උද්‍යාන ආදී සහ සංවෘත අවකාශ ද ඇතුළත්ව)

d. දුම්කොළ හා මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය පනත තුළ දුම්පානය සංඥෙය කළ නොහැකි වරදක් (Cognizable Offence) බවට පත් කිරීම සඳහා වූ සංශෝධනය.

e. දුම්කොළ හා මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය පනතට අදාළ දඩ මුදල් සංශෝධනය කිරීම සඳහා වූ සංශෝධනය

f. මාර්ගගත ක්‍රමවේද ඔස්සේ දුම්කොළ නිෂ්පාදන ප්‍රවර්ධනය කිරීම තහනම් කිරීම සඳහා වූ සංශෝධනය

g. සම්මත ඇසුරුම්කරණය සඳහා වූ සංශෝධනය.

xix. රට තුළ මද්‍යසාර භාවිතය පාලනය කිරීම සඳහා මූලිකව අවධානය යොමු කරමින් ජාත්‍යන්තර වෙළෙඳ ගිවිසුම්වල ඇති කොන්දේසිවලට අවශ්‍ය ප්‍රතිපත්තිමය තීරණ ගැනීම.

xx. කර්මාන්ත සඳහා යොදා ගන්නා මද්‍යසාර නිෂ්පාදන ආනයනය කිරීමේ දී දැඩි පාලනයක් සිදු කිරීම සහ ආනයනය කරන එවැනි රසායන ද්‍රව්‍ය අදාළ නිෂ්පාදන කාර්යයන් සඳහාම පමණක් යොදා ගන්නා බවට තහවුරු කර ගැනීමට කටයුතු කිරීම.

xxi. 2006 අංක 27 දරන දුම්කොළ හා මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරී පනතේ 35 වන වගන්තිය බලාත්මක කිරීමට අවශ්‍ය පහසුකම් සලසා දීම

xxii. මත්ද්‍රව්‍ය පාලනයට අදාළව නීතිය ක්‍රියාත්මක කරන සියලුම ආයතනවල සහභාගීත්වයෙන් නීතිය ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය මෙන්ම, ඒ ආශ්‍රිත නව ප්‍රවණතා සහ පවතින ගැටළු පිළිබඳව අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ හෝ යෝජිත මත්ද්‍රව්‍ය පාලන ජාතික කොමිෂන් සභාවේ මූලිකත්වයෙන් සාකච්ඡා කිරීම (අවම වශයෙන් මාස තුනකට වරක්)

xxiii. දුම්වැටි සහ දුම්කොළ ආශ්‍රිත නිෂ්පාදන අලෙවි කිරීම සඳහා බලපත්‍ර ක්‍රමයක් හඳුන්වාදීම සහ ඒ වෙනුවෙන් අදාළ ආයතනය සඳහා බලය පැවරීම.

xxiv. ඊ සිගරට් හෝ විද්‍යුත් ආකාරයෙන් ක්‍රියාත්මක කරනු ලබන දුම් උරා බොන උපකරණ ආනයනය, විකිණීම, විකිණීමට ඉදිරිපත් කිරීම, බෙදා හැරීම සහ සන්තකයේ තබා ගැනීම තහනම් කරමින් නීති සම්පාදනය කිරීම.

xxv. සුරාබදු බලපත්‍ර රහිත ආපනශාලා තුළ මද්‍යසාර භාවිතය සඳහා නෛතිකමය වශයෙන් ප්‍රතිපාදන නොමැති අතර, එවැනි ස්ථානයන්හි එලෙස භාවිත කිරීම තහනම් කරමින් නීතිමය ප්‍රතිපාදන සකස් කිරීම.

xxvi. මද්‍යසාර සහ දුම්වැටි ප්‍රවර්ධනය වන ආකාරයෙන් කටයුතු කිරීම සහ ප්‍රසිද්ධ ස්ථානවල ඒවා භාවිත කිරීම වැළැක්වීම සඳහා අදාළ නීති සංශෝධනය කිරීම සහ බලාත්මක කිරීම. (අදාළ පනත මගින් පොදු ස්ථාන, මුහුදු වෙරළ, මහා මාර්ගය සහ උද්‍යාන ආදී වශයෙන් විස්තීරණ ලෙස දක්වා, එම ස්ථානවල මද්‍යසාර සහ දුම්වැටි භාවිතයට ඉඩ ලබා නොදීම.)

xxvii. දේශීය සහ විදේශීය වශයෙන් මෙරට ක්‍රියාත්මක වන තැපැල් සහ භාණ්ඩ හුවමාරු ආයතන ලියාපදිංචි කිරීමට සහ නියාමනය කිරීමට හැකි වන පරිදි තැපැල් පනත සංශෝධනය කිරීම. එකී භාණ්ඩ හුවමාරු කරන්නා, සේවා සපයන්නා, ලබා ගන්නා සහ භාණ්ඩ ඉදිරිපත් කරන්නා නිසි පරිදි හඳුනා ගැනීමට අදාළව රෙගුලාසි පැනවීම සිදු කිරීම.

xxviii. තැපැල් බෙදා හැරීම් හරහා සිදු කෙරෙන මත්ද්‍රව්‍ය ජාවාරම් හඳුනා ගැනීම සඳහා නිලධාරීන්ගේ ධාරිතා වර්ධනය.

## 3.0 ප්‍රතිකාරය හා පුනරුත්ථාපනය

### 3.1 පුනරුත්ථාපනය

i. ශ්‍රී ලංකාව තුළ මත්ද්‍රව්‍ය භාවිතයට ඇබ්බැහි වූ කාන්තාවන් පුනරුත්ථාපනය කිරීම සඳහා සුදුසු මධ්‍යස්ථාන පිහිටුවීම සහ ගම් මට්ටමින් උපදේශන සේවාවන් ක්‍රියාත්මක කිරීම.

ii. මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වූවන් පුනරුත්ථාපනය කර සමාජගත කිරීමේ දී ඔවුන්ට සුදුසු වෘත්තීය පුහුණුවක් ලබා දීම ඒ සඳහා පිහිටුවන ආයතනවල අනිවාර්ය අංගයක් බවට පත් කිරීම.

iii. මත් ද්‍රව්‍යවලට ඇබ්බැහි වී සිටින පාසැල් දරුවන් පුනරුත්ථාපනය කිරීම සඳහා වෙනම ක්‍රමවේදයක් ඇති කිරීම.

iv. පුනරුත්ථාපනයෙන් මුදා හරින පුද්ගලයන් සම්බන්ධයෙන් අනිවාර්ය පසුවිපරමක් සිදු කිරීම.

### 3.2. ප්‍රතිකාරය

i. රජයේ රෝහල්වල මනෝ වෛද්‍ය ඒකකවල පුනරුත්ථාපනය සහ ප්‍රතිකාර සේවාවන් ලබා දෙන බැවින් එම ඒකක වඩාත් ආරක්ෂිත ඒකක වශයෙන් සංවර්ධනය කිරීම

ii. සෞඛ්‍ය අමාත්‍යාංශය, අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය සහ ශ්‍රී ලංකා මනෝ වෛද්‍යවරුන්ගේ සංගමය මැදිහත් වී පුනරුත්ථාපනය සහ ප්‍රතිකාරය සඳහා විද්‍යාත්මක පදනමක් සහිත විධිමත් වැඩපිළිවෙළක් සකස් කිරීම.

iii. විශේෂඥ මනෝ වෛද්‍යවරුන් අවශ්‍ය ප්‍රමාණයට නොමැතිවීම හේතුවෙන් ඉදිරියේ දී ප්‍රතිකාර අංශය දුර්වල වීමේ ඉඩකඩක් පවතින බැවින් වෛද්‍ය නිලධාරීන් ප්‍රතිකාරය සඳහා පුහුණු කර, ඒ සඳහා ඔවුන්ගේ හැකියාවන් දියුණු කිරීම.

iv. මත් ද්‍රව්‍ය සඳහා වූ ඇබ්බැහියෙන් මිදී නැවත සමාජගත වීම සඳහා අවශ්‍ය සේවාවන් සැපයීම සඳහා මනෝ චිකිත්සන සේවාවන් ප්‍රවර්ධනය කිරීම.

v. ආයතනගත ප්‍රතිකාර ක්‍රමවේදයට අමතරව ප්‍රජා පාදක ප්‍රතිකාර ක්‍රමවේද සඳහා යොමුවීම සහ ඒ සඳහා මත්ද්‍රව්‍ය භාවිත කරන පුද්ගලයන්ගේ පවුල්වල සහ ප්‍රජාවේ සහයෝගය ලබා ගැනීම.

vi. බන්ධනාගාර ආශ්‍රිත ප්‍රතිකාර ක්‍රමවේදය වඩාත් විධිමත් කිරීම.

## 4.0 මත්ද්‍රව්‍ය පාලන ජාතික කොමිෂන් සභාවක් පිහිටුවීම

මත්ද්‍රව්‍ය මර්දන කටයුතු ජාතික මට්ටමින් සම්බන්ධීකරණය කිරීම, ආවේක්ෂණය කිරීම, අධීක්ෂණය කිරීම, උපදෙස් ලබා දීම සහ මහජන පැමිණිලි විභාග කිරීම සඳහා පහත යෝජනා කර ඇති සංයුතියකින් සමන්විත වන මත්ද්‍රව්‍ය විරෝධී ජාතික කොමිෂන් සභාව නමින් හැඳින්වෙන අග්‍ර ආයතනයක් පිහිටුවීම සඳහා නව නීතිමය රාමුවක් හඳුන්වා දීම.

දුම්කොළ, මද්‍යසාර සහ මත්ද්‍රව්‍ය පාලන ජාතික කොමිෂන් සභා පනත නමින් නව නීතිමය රාමුවක් හඳුන්වා දීම. ඊට අදාළව විශේෂිත යෝජනා පහත පරිදි වේ:

### 4.1. කොමිෂන් සභාවේ සංයුතිය සහ නියෝජනය

I. විශ්‍රාමික මහාධිකරණ /අභියාචනාධිකරණ /ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුවරුන් තිදෙනෙක්

II. ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති තනතුරට නොඅඩු තනතුරක් දරන ලද විශ්‍රාමික පොලිස් නිලධාරියෙක්

III. මේජර් ජනරාල් හෝ ඊට සමාන නිලයක් දරන ලද විශ්‍රාමික ත්‍රිවිධ හමුදා නිලධාරියෙක්

IV. මත්ද්‍රව්‍ය නිවාරණ සහ පුනරුත්ථාපන ක්ෂේත්‍රයේ විශේෂඥතාවය සහිත පුද්ගලයෙක්

V. මත්ද්‍රව්‍ය නිවාරණ ක්ෂේත්‍රයේ පිළිගත් සමාජ ක්‍රියාකාරිකයෙක්

### 4.2. උපදේශක සභාවක් පිහිටුවීම

i. කොමිෂන් සභාවට අවශ්‍ය තාක්ෂණික සහ විශේෂඥ උපදෙස් ලබාදීම සඳහා මත්ද්‍රව්‍ය නිවාරණය සහ ප්‍රතිකාරය සම්බන්ධ සියලු ක්ෂේත්‍ර ආවරණය වන ලෙස විද්වතුන්ගෙන් සමන්විත උපදේශක සභාවක් පිහිටුවීම සහ ඊට අදාළ උපකමිටු පත් කිරීම.

### 4.3. කොමිෂන් සභාවේ බලතල සහ කාර්යයන්

i. මත්ද්‍රව්‍ය නිවාරණය, ප්‍රතිකාරය, පුනරුත්ථාපනය සහ පාලනය කිරීමට අදාළව පිහිටුවා ඇති සියලුම ආයතනවල ක්‍රියාකාරීත්වය සහ අදාළ නීති ක්‍රියාත්මක කිරීම පිළිබඳව ආවේක්ෂණය කිරීම, අධීක්ෂණය කිරීම, වාර්තා කැඳවීම සහ නිර්දේශ ලබාදීම.

ii. මහජන පැමිණිලි විභාග කිරීම සහ අදාළ ආයතනවලට නිර්දේශ ඉදිරිපත් කිරීම

iii. මත්ද්‍රව්‍ය නිවාරණ, ප්‍රතිකාර හා පුනරුත්ථාපන ආයතන අධීක්ෂණය කිරීම සහ නිර්දේශ ලබා දීම

iv. අදාළ පර්යේෂණ පැවැත්වීම සහ තොරතුරු ලබා ගැනීම සඳහා රාජ්‍ය ආයතන හෝ විශ්ව විද්‍යාල වෙත බලය පැවරීම (කොමිෂන් කිරීමේ බලය) සඳහා අංශයක් පවත්වාගෙන යාම සහ අදාළ තොරතුරු ප්‍රකාශයට පත් කිරීම.

v. මත්ද්‍රව්‍ය නිවාරණය, ප්‍රතිකාරය සහ පුනරුත්ථාපනය සිදු කරන ස්වේච්ඡා සංවිධාන සහ විශේෂඥතාවය සහිත පුද්ගලයින් හඳුනා ගැනීම සහ සම්පත්දායක සංචිතයක් පවත්වාගෙන යාම.

vi. ජාතික මත්ද්‍රව්‍ය පාලන අරමුදල පිහිටුවීම සහ අරමුදල් කළමනාකරණයට අදාළ ව්‍යවස්ථා පැනවීම (දඩ මුදල් සහ දේපළ අත්පත් කර ගැනීම්වල වටිනාකමින් 50% අරමුදලට බැර කිරීම සහ දුම්කොළ සහ මද්‍යසාර ලාභයෙන් 1% ක හානිපූර්ණ බද්දක් පැනවීම)

vii. ජාතික ප්‍රතිපත්ති සකස් කිරීම, වාර්ෂික වාර්තා, කාර්යසාධන වාර්තා සහ විශේෂ වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම

viii. නීති සංශෝධනය ඇතුළු ප්‍රතිපත්ති සහ උපායමාර්ගික ප්‍රවේශයන් පිළිබඳව අදාළ විෂයභාර අමාත්‍යවරයාට උපදෙස් ලබා දීම (ආයතනවලට අවශ්‍ය පහසුකම්, පිරිස් බලය පිළිබඳ නිර්දේශ ඇතුළුව)

ix. ජනමාධ්‍ය සහ සමාජ මාධ්‍ය සඳහා ප්‍රමිතීන් සහ නිර්ණායක පැනවීමේ බලය

## 4.4. <u>වෙනත් ප්‍රතිපාදන</u>

I. ස්වේච්ඡාවෙන් කොමිෂන් සභාවට තොරතුරු ලබාදෙන සහ කොමිෂන් සභාව විසින් කැඳවා ප්‍රශ්න කිරීමේදී තොරතුරු ලබාදෙන රාජ්‍ය නිලධාරීන්ට මුක්තිය ලබා දීම

II. ඕනෑම ආයතනයකින් මත්ද්‍රව්‍ය පාලනයට අදාළ තොරතුරු ඉල්ලා සිටීමේ බලය.

## <u>ඇමුණුම 1</u>

2023 ජුලි මස 27 වැනි දින සිට මේ දක්වා පැවති රැස්වීම් වාර 11 දී කාරක සභාව වෙත කැඳවා තිබෙන මත්ද්‍රව්‍ය නිවාරණ ක්ෂේත්‍රයට අදාළ රාජ්‍ය ආයතන, රාජ්‍ය නොවන ආයතන සහ ක්ෂේත්‍රයේ ක්‍රියාකාරීන් මෙසේය.

<u>රාජ්‍ය ආයතන</u>

1. මහජන ආරක්ෂක අමාත්‍යාංශය
2. මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය
3. අධ්‍යාපන අමාත්‍යාංශය
4. ජනමාධ්‍ය අමාත්‍යාංශය
5. සෞඛ්‍ය අමාත්‍යාංශය
6. අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය
7. බුද්ධශාසන ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය
8. ශ්‍රී ලංකා නාවික හමුදාව
9. ශ්‍රී ලංකා ගුවන් හමුදාව
10. ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව
11. අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය
12. ශ්‍රී ලංකා පොලීසිය
13. ආගමන හා විගමන දෙපාර්තමේන්තුව
14. ශ්‍රී ලංකා රේගුව
15. දේශීය ආදායම් දෙපාර්තමේන්තුව
16. සුරාබදු දෙපාර්තමේන්තුව
17. ශ්‍රී ලංකා වරාය අධිකාරිය
18. ගුවන්තොටුපල සහ ගුවන් සේවා (ශ්‍රී ලංකාව) පුද්ගලික සමාගම
19. ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව
20. තැපැල් දෙපාර්තමේන්තුව
21. දුම්කොළ හා මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය
22. නීතිපති දෙපාර්තමේන්තුව
23. බන්ධනාගාර දෙපාර්තමේන්තුව
24. ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තුව
25. පුනරුත්ථාපන කාර්යාංශය
26. රජයේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව
27. ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව

**<u>රාජ්‍ය නොවන ආයතන හා ක්ෂේත්‍රයේ ක්‍රියාකාරීන්</u>**

1. මද්‍යසාර හා මත්ද්‍රව්‍ය තොරතුරු මධ්‍යස්ථානය
2. මැල් මැදුර
3. කැඩ් ප්‍රී ශ්‍රී ලංකා
4. ශ්‍රී ලංකා මනෝ වෛද්‍යවරුන්ගේ සංගමය
5. ශ්‍රී ලංකා නීතිඥ සංගමය
6. මිතුරු මිතුරෝ සංවිධානය
7. සමස්ත ලංකා අමද්‍යප තරුණ සංවිධානය
8. මහාචාර්ය දියනාත් සමරසිංහ මහතා, විශ්‍රාමික මනෝ වෛද්‍ය
9. නිසල් ජෙරාඩ් පෙරේරා මහතා, මනෝ විද්‍යාඥ
10. සදිස සංවර්ධන ජාලය
11. ශ්‍රී ලංකා අමද්‍යප මහා සභාව
12. හෙල්දි ලංකා ආයතනය
13. වෛද්‍ය වසන්ත බණ්ඩාර මහතා
14. නීතිඥ කල්‍යාණනන්ද තිරාණගම මහතා
15. වෛද්‍ය සරත් සමරගේ මහතා
16. පුබුදු සුමනසේකර මහතා

රට තුළ සීඝ්‍ර ලෙස පැතිරෙමින් පවතින මත්ද්‍රව්‍ය උවදුර වහා පාලනය කොට මුලිනුපුටා දැමීම සඳහා ක්‍රියාත්මක කළ යුතු ක්‍රමවේද පිළිබඳව කරුණු සොයා බලා ඒ පිළිබඳව නිරීක්ෂණ හා නිර්දේශ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම සඳහා වන පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවේ සාමාජිකයන් වන අපි මෙම කාරක සභාවේ වාර්තාව අනුමත කරන්නෙමු.

| | |
|---|---|
| ගරු ටිරාන් අලස් මහතා (සභාපති) | .................................. |
| ගරු නීතිඥ සිසිර ජයකොඩි මහතා | .................................. |
| ගරු (වෛද්‍ය) සීතා අරඹේපොල මහත්මිය | *අනුමත කරන ලදී (විදේශගතව ඇත)* |
| ගරු බුද්ධික පතිරණ මහතා | .................................. |
| ගරු ජයන්ත සමරවීර මහතා | .................................. |
| ගරු (වෛද්‍ය) ගයාෂාන් නවනන්ද මහතා | .................................. |
| ගරු (වෛද්‍ය) උපුල් ගලප්පත්ති මහතා | .................................. |
| ගරු (මේජර්) සුදර්ශන දෙනිපිටිය මහතා | .................................. |
| ගරු අසංක නවරත්න මහතා | .................................. |
| ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ මහතා | .................................. |
| ගරු තවරාජා කලෙයි අරසන් මහතා | .................................. |
| ගරු මංජුලා දිසානායක මහත්මිය | .................................. |

..................................

චින්තා බුලත්සිංහල
කාරක සභාවේ ලේකම් සහ පාර්ලිමේන්තුවේ මහ ලේකම් වෙනුවට